# පළමුවැනි කොටස

# බර සහ මිණුම්

## පරිවර්තන සාධක

**බ්‍රිතාන්‍ය ඒකක සඳහා මෙට්‍රික් ඒකක**

| | | |
|---|---|---|
| අක්කර 1 | = | හෙක්ටෙයාර් (හෙ.) 0·405 |
| රාත්තල් 1 | = | කිලෝ ග්‍රෑම් (කි. ග්‍රෑ.) 0·454 |
| දිගු ටොන් 1 (රා: 2240) | = | මෙට්‍රික් ටොන් (මෙ. ටො.) 1·016 |
| හොණ්ඩර 1 | = | කි. ග්‍රෑ. 50·802 |
| සැතපුම් 1 | = | කිලෝ මීටර් (කි. මී.) 1·609 |
| දිගු ටොන් සැතපුම් 1 | = | මෙ. ටො. කි. මී. 1·635 |
| අක්කරයට රාත්තල් 1 | = | හෙක්ටයාරයට කිලෝ ග්‍රෑම් 1·121 |
| අක්කරයට හොණ්ඩර 1 | = | හෙක්ටයාරයට කි. ග්‍රෑ. 125·536 |
| පයින්ට් 1 | = | ලීටර් 0·57 |
| එ. රා. ගැලුම් 1 | = | ලීටර් 4·55 |

**මෙට්‍රික් ඒකක සඳහා බ්‍රිතාන්‍ය ඒකක**

| | | |
|---|---|---|
| හෙක්ටයාර් 1 | = | අක්කර 2·471 |
| කිලෝ ග්‍රෑම් 1 | = | රාත්තල් 2·205 |
| මෙට්‍රික් ටොන් 1 (කි. ග්‍රෑ. 1000) | = | දිගු ටොන් 0·984 |
| මීටර් 1 | = | අඩි 3·281 |
| කිලෝ මීටර් 1 | = | සැතපුම් 0·621 |
| මෙට්‍රික් ටොන් කිලෝ මීටර් 1 | = | දිගු ටොන් සැතපුම් 0·612 |
| ලීටර් 1 | = | පයින්ට් 1·76 = එ. රා. ගැලුම් 0·219 |
| හෙක්ටයාරයට කි. ග්‍රෑ. 1 | = | අක්කරයට රාත්තල් 0·892 |

**වී/සහල් පරිවර්තන**

| | | |
|---|---|---|
| වී බුසල් 1 (රාත්තල් 46) | = | කි. ග්‍රෑ. 20·87 |
| වී මෙට්‍රික් ටොන් 1 | = | වී බුසල් 47·92 |
| | = | සහල් මෙට්‍රික් ටොන් 0·7 |
| සහල් මෙට්‍රික් ටොන් 1 | = | වී බුසල් 68·46 |
| | = | වී මෙට්‍රික් ටොන් 1·43 |
| අක්කරයට වී බුසල් 1 | = | හෙක්ටයාරයට වී කි. ග්‍රෑ. 51·55 |

# 1982 ආර්ථික ක්‍රියාකාරිත්වය, ගැටළු සහ ප්‍රතිපත්ති

## හැඳින්වීම

1982 දී ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතය (ද.ජා.නි.) ස්ථාවර සාධක වියදම් මිල අනුව සියයට 4.9 කින් වැඩි වූ බව ගණන් බලා ඇත. 1981 දී සියයට 4.1 ක් වූ මූර්ත දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධන අනුපාතිකයේ සුළු වශයෙන් වූ වැඩි දියුණුවක් මෙයින් පිළිබිඹු කරයි. 1981 දී සියයට 5.8 ක වර්ධන අනුපාතිකයක් වාර්තා කළ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) මෙම වසරේදී සියයට 5.1 කින් වැඩි වූ බව ගණන් බලා ඇත. මීට ප්‍රධාන හේතුව වී ඇත්තේ, 1982 වසරේ දී, විදේශයනට ගලා ගිය ශුද්ධ සාධක ආදායම 1981 වසරට වඩා අඩු වීමයි.

1982 දී දළ ජාතික නිෂ්පාදිතය පවත්නා සාධක වියදම් මිල අනුව රුපියල් දශ ලක්ෂ 89,674 ක් වූ අතර, ස්ථාවර මිල අනුව රුපියල් දශ ලක්ෂ 21,246 ක් ලෙස ගණනය කොට ඇත. 1982 දී ආරෝපිත දළ ජාතික නිෂ්පාදන අවධමනකය සියයට 10.2 ක් ලෙස ගණනය කොට ඇති අතර එය, මිල ගණන් සඳහා සියයට 19 ක වැඩිවීමක් දැක්වූ 1981 අවධමනකයට වඩා සැළකිය යුතු පහත වැටීමක් පෙන්වීය. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ තාවකාලික ඇස්තමේන්තුව අනුව, ශ්‍රී ලංකාවේ ජනගහණය සියයට 1.7 කින් වැඩි වී ඇති බව පෙන්නුම් කරයි. ජනගහණයේ වැඩිවීම සඳහා ගැළපීම් කිරීමෙන් පසු, 1981 දී සියයට 2.4 කින් වැඩි වූ මූර්ත ඒක පුද්ගල ආදායම මෙම වසරේ දී සියයට 3.5 කින් වැඩි විය. පවත්නා මිල අනුව ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය රුපියල් 5,904 ක් හෙවත් එ.ජ. ඩොලර් 284 ක් විය.

**1 · 1 සංඛ්‍යා සටහන**

**ජාතික ආදායම් පිළිබඳ සංඛ්‍යා 1979—1982**

| ශීර්ෂය | වටිනාකම (රු. දශලක්ෂ) | | | | වර්ධන අනුපාතිකය (සියයට) | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1979 | 1980* | 1981* | 1982* | 1979 | 1980 | 1981 | 1982 |
| 1. පවත්නා සාධක වියදම් මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය .. | 49,782 | 62,246 | 79,337 | 91,643 | 23.0 | 25.0 | 27.5 | 15.5 |
| 2. ස්ථාවර (1970) සාධක වියදම් මිල අනුව දේශීය නිෂ්පාදිතය .. | 18,501 | 19,575 | 20,706 | 21,756 | 6.3 | 5.8 | 5.8 | 5.1 |
| 3. පවත්නා සාධක වියදම් මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය .. | 49,542 | 61,814 | 77,625 | 89,674 | 23.1 | 24.8 | 25.6 | 15.5 |
| 4. ස්ථාවර (1970) සාධක වියදම් මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය** .. | 18,430 | 19,456 | 20,257 | 21,246 | 6.4 | 5.6 | 4.1 | 4.9 |
| 5. මැදි වසර ජනගහනය (දශ ලක්ෂ) .. | 14.5 | 14.7 | 15.0 | 15.2 | 2.0 | 1.8 | 1.7 | 1.7 |
| 6. ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය (රුපි.) | | | | | | | | |
| i පවත්නා මිල අනුව .. | 3,424 | 4,194 | 5,179 | 5,904 | 20.7 | 22.5 | 23.5 | 14.0 |
| ii ස්ථාවර මිල අනුව** .. | 1,274 | 1,320 | 1,352 | 1,399 | 4.3 | 3.6 | 2.4 | 3.5 |

* තාවකාලික
** සංශෝධිත

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

ආර්ථිකයේ ආංශික ක්‍රියාකාරිත්වයේ විග්‍රහයක් කෙරෙන 1.2 සංඛ්‍යා සටහනෙහි දැක්වෙන පරිදි, 1982 දී මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය පහත වැටීමට ප්‍රධාන වශයෙන්ම හේතුවූයේ, කෘෂිකර්මයේ පහත් වර්ධන අනුපාතිකයයි. විශේෂයෙන්ම, මෙය තේ සහ වී වගා අංශයන්හි වාර්තා වූ සෘණ වර්ධන අනුපාතිකය නිසා සිදු විය. ඉකුත් වසරේදී සියයට

6.9 ක වර්ධනයක් පෙන්වූ දැව ආදී වන ද්‍රව්‍ය සහ ධීවර කර්මාන්තය ද ඇතුළු කෘෂිකාර්මික අංශය සමස්ථයක් ලෙස ගත්කල, මෙම වර්ෂය තුළදී වර්ධනය වී ඇත්තේ සියයට 2.6 කින් පමණි. තේ සැකසීම් ප්‍රමාණයේ අඩුවීම හේතු කොට ගෙන, නිමැවුම් කර්මාන්ත අංශයේ එකතු කළ වටිනාකම ද අඩුවිය. කෙසේ වුවද, කාර්මික අපනයන ඇතුළු කර්මාන්ත නිෂ්පාදන හා අනෙකුත් කර්මාන්තවල එකතු කළ වටිනාකම ඉකුත් වර්ෂයට වඩා සියයට 9.1 කින් වැඩි විය. තැනීම් කටයුතු අංශය පිළිවෙලින් දෙවන වසරටත් ඍණ වර්ධන අනුපාතිකයක් වාර්තා කළේය. 1982 වර්ෂය සඳහා ඉහළ වර්ධන අනුපාතිකයක් දැක්වූයේ, තොග සහ සිල්ලර වෙළෙඳාම, ප්‍රවාහනය සහ අනෙකුත් සේවා ඇතුළත් වන සේවා අංශය පමණි. 1982 දී මෙහි ක්‍රියාකාරිත්වය බොහෝ දුරට පවත්වාගෙන ගියේ, ඉහළ මට්ටමක පැවති ආනයනවලිනි.

නිමැවුම අතින් බලන කල, සියයට 10.6 කින් අඩු වූ තේ නිෂ්පාදනය, තියුණු පසුබැස්මකට භාජනය විය. වර්ෂය තුළදී නිෂ්පාදනය කළ තේ ප්‍රමාණය කිලෝග්‍රෑම් දශ ලක්ෂ 187.8 ක් වූ අතර, 1981 දී එය කිලෝග්‍රෑම් දශ ලක්ෂ 210 ක් විය. නිෂ්පාදනයේ පහත වැටීමට මූලික වශයෙන් හේතු වූයේ, වර්ෂය තුළ දී දළු නෙලා ගන්නා බිම් ප්‍රමාණය අඩුවීමටත් වඩා, හෙක්ටයාරයකට ලැබෙන සාමාන්‍ය එළදාව පහත වැටීමය. සාමාන්‍ය එළදාවේ පහත වැටීම, වර්ෂයේ මුල් කාර්තුව තුළ දී පැවැති අහිතකර කාලගුණික තත්ත්වය සමග කිට්ටු සම්බන්ධතාවයක් පෙන්විය. රබර් කිරි කැපෙන බිම් ප්‍රමාණයෙහි පහත වැටීමක් ඇති වුවද, හෙක්ටයාරයකට ලැබෙන සාමාන්‍ය එළදාව ඉකුත් වසරට වඩා වැඩිවීම හේතු කොට ගෙන, රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් දශ ලක්ෂ 125 දක්වා කිලෝග්‍රෑම් දශ ලක්ෂයකින් සුළු වශයෙන් වැඩි විය. එසේ වුවත්, 1982 දී හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 726 ක් වූ මෙම සාමාන්‍ය එළදාව, 1978 දී හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 845 ක් වූ මෙතෙක් ලද ඉහළම සාමාන්‍ය එළදාවට වඩා බෙහෙවින් අඩුය. මේ අතර, ගෙඩි නිෂ්පාදනයේ සියයට 11 ක වැඩිවීමක් වාර්තා කරමින් පොල් වගා අංශය සිය සතුටුදායක වර්ධනය තවදුරටත් පවත්වා ගනු ලැබීය. 1982 දී පොල් නිෂ්පාදනය ගෙඩි දශ ලක්ෂ 2,510 ක් විය. සුළු අපනයන භෝගවල අපනයන ඉපයුම් පිළිබඳ සංඛ්‍යා තොරතුරු අනුව බලන කල, අපනයන පරිමාව, සියයට 43 කින් වැඩි වූ කෝපිවල හැර, මෙම අංශයේ අනෙකුත් භෝගවල නිෂ්පාදනය පහත වැටී ඇත.

1982 දී මෙට්‍රික් ටොන් 21,56,000 ක් වූ වී නිෂ්පාදනය, ගතවූ වර්ෂයේ නිෂ්පාදනයට වඩා සියයට 3.3 ක පහත වැටීමක් පෙන්නුම් කළේය. එහෙත්, මෙය මහ කන්නයේ නිෂ්පාදනය කෙරෙහි අහිතකර ලෙස බල පෑ නියං තත්ත්වයෙහි ප්‍රතිඵලයක් ලෙස ඇති වූ තාවකාලික පසුබෑමකි. කෙසේ වුවද,1982 යල කන්නයේ නිෂ්පාදනයේ සියයට 12 ක සැළකිය යුතු වැඩිවීමක් වාර්තාවී ඇත. සමස්ථයක් වශයෙන් ගත් කල, අතුරු ආහාර භෝග වගා අංශයේ ක්‍රියාකාරිත්වය, ඉතා තියුණු වර්ධනයක් පෙන් වූ සෝයා බෝංචි නිෂ්පාදනය නිසා සතුටුදායක විය. 1981 වර්ෂයේ දී සුළු දියුණුවක් පෙන්වූ සීනි නිෂ්පාදනය, 1982 දී මෙට්‍රික් ටොන් 22,783 දක්වා සියයට 4 කින් අඩු විය. මේ අතර, බිත්තර සහ කිරි නිෂ්පාදනය පිළිවෙලින් සියයට 7 කින් සහ සියයට 1.6 කින් පහත වැටී ඇති ලෙස ගණන් බලා ඇති අතර, ධීවර අංශයේ නිමැවුම සියයට 2.9 කින් වැඩි වූ බවට ඇස්තමේන්තු කර ඇත.

ඉකුත් වසරේ දී පෙන් වූ කැපී පෙනෙන වර්ධනය 1982 වර්ෂයේදී පවත්වා ගැනීමට කෘෂිකාර්මික අංශය අපොහොසත් වූ නමුත්, මුළු කාර්මික නිෂ්පාදනය 1982 වර්ෂයේ දී මූර්ත වශයෙන් සියයට 9.1 කින් වැඩි විය. ඇත්ත වශයෙන්ම, නිමැවුමෙහි මෙම වැඩිවීම, 1978 වර්ෂයට පසුව වාර්තා වූ විශාලතම වැඩිවීම විය. මෙය, බොහෝදුරට 1982 වර්ෂය තුළ දී අඛණ්ඩ විදුලිබල සැපයුමේ ද ආධාර ඇතිව රාජ්‍ය අංශයේ කර්මාන්තවල ඉහළ මට්ටමක වූ නිමැවුම සහ අපනයනය පදනම් කොට ගත් පෞද්ගලික කර්මාන්තවල ඉහළ නිමැවුම යන කරුණු දෙකෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයකි. පෞද්ගලික අංශයේ කර්මාන්තවල නිමැවුම සියයට 18 කින් වැඩි වූ අතර, රාජ්‍ය අංශයේ නිමැවුම සියයට 5 කින් වැඩි විය. රාජ්‍ය අංශයෙන් කර්මාන්ත නිෂ්පාදිතයට සියයට 60 කට වැඩි ප්‍රමාණයකින් දායක වී ඇති හෙයින්, එහි වර්ධනය පෞද්ගලික අංශයේ වර්ධනයට වඩා අඩු වුවද, කර්මාන්ත අංශයේ නිෂ්පාදිතයේ ඉහළ වර්ධනය කෙරෙහි වෙසෙසින් බලපා ඇත.

## 1 . 2 සංඛ්‍යා සටහන

### දළ ජාතික නිෂ්පාදිතයේ සංයුතිය සහ වර්ධනය 1978—1982
### (1970 සාධක වියදම් මිල අනුව)

| අංශය | ප්‍රමාණය (රුපියල් දශ ලක්ෂ) | | | | | වර්ධන අනුපාතික | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1978 | 1979 | 1980 (අ) | 1981 (අ) | 1982 (අ) | 1979 | 1980 | 1981 | 1982 |
| 1. කෘෂිකර්මය, වන සහ ධීවර .. .. | 4,532 | 4,622 | 4,766 | 5,097 | 5,231 | 2·0 | 3·1 | 6·9 | 2·6 |
| 1.1 තේ .. .. | 398 | 412 | 381 | 419 | 374 | – 3·4 | – 7·5 | 10·0 | – 10·7 |
| 1.2 රබර් .. .. | 225 | 223 | 194 | 181 | 182 | – 0·9 | – 13·0 | – 6·7 | 0·6 |
| 1.3 පොල් .. .. | 488 | 519 | 462 | 515 | 573 | 6·4 | – 11·0 | 11·5 | 11·3 |
| 1.4 වී .. .. | 1,116 | 1,132 | 1,267 | 1,313 | 1,269 | 1·4 | 11·9 | 3·6 | – 3·4 |
| 1.5 අනෙකුත් (අතුරුභෝග, වන හා ධීවර ඇතුලු) .. | 2,305 | 2,336 | 2,462 | 2,669 | 2,833 | 1·3 | 5·4 | 8·4 | 6·1 |
| 2. පතල් සහ කැනීම් .. .. | 619 | 652 | 684 | 713 | 742 | 5·3 | 4·9 | 4·2 | 4·1 |
| 3. නිමැවුම් කර්මාන්ත .. .. | 2,541 | 2,659 | 2,681 | 2,820 | 2,955 | 4·6 | 0·8 | 5·2 | 4·8 |
| 3.1 වෘක්ෂ භෝග සැකසීම .. .. | 840 | 877 | 791 | 851 | 806 | 4·4 | – 9·8 | 7·6 | – 5·3 |
| 3.2 අනෙකුත් .. .. | 1,701 | 1,782 | 1,890 | 1,969 | 2,149 | 4·8 | 6·1 | 4·2 | 9·1 |
| 4. තැනීම් .. .. | 794 | 960 | 1,066 | 1,034 | 1,013 | 20·1 | 11·0 | – 3·0 | – 2·0 |
| 5. සේවා .. .. | 8,915 | 9,608 | 10,378 | 11,042 | 11,815 | 7·8 | 8·0 | 6·4 | 7·0 |
| 6. ද. දේ. නි .. .. | 17,401 | 18,501 | 19,575 | 20,706 | 21,756 | 6·3 | 5·8 | 5·8 | 5·1 |
| 7. විදේශීය ශුද්ධ සාධක ආදයම .. .. | – 72 | – 71 | – 119 | – 449 | – 510 | — | — | — | — |
| 8. ද. ජා. නි. .. .. | 17,329 | 18,430 | 19,456 | 20,257 | 21,246 | 6·4 | 5·6 | 4·1 | 4·9 |

(අ) තාවකාලිකයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

අංශ වශයෙන් ගත් කල, කාර්මික නිෂ්පාදනයේ සැළකිය යුතු වැඩිවීම් වාර්තා කළේ රෙදි පිළි හා ඇඟලුම් සහ හම් නිෂ්පාදිත, දැව හා දැව නිෂ්පාදිත, සැකසූ ලෝහ නිෂ්පාදිත, රසායනික හා ඛනිජ තෙල් නිෂ්පාදිත සහ කඩදසි හා කඩදසි නිෂ්පාදිත අංශයන්හි ය. රාජ්‍ය අංශයේ නිෂ්පාදනය වැඩිවීමට බොහෝ දුරට හේතු වූයේ, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තෙල් පිරිපහදුව නොකඩවා ක්‍රියාත්මක කරවමින් තැබීමත්, වෙනත් සංස්ථා බොහොමයකම ඉහළ මට්ටමක ධාරිතා උපයෝජනයත් ය.

1982 මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන අනුපාතිකය සුළු වශයෙන් අඩුවීමට හේතු වූ කරුණු නැවත නැවත ඇති නොවිය හැකි ස්වභාවයේ ඒවා බව පැහැදිලි වශයෙන්ම කිවහැක. තේ සහ වී නිෂ්පාදනයේ පහත වැටීමට බොහෝ දුරට හේතු වූයේ, අහිතකර කාලගුණික තත්ත්වයන් ය. මුළු දේශීය නිෂ්පාදනයේ මෙම භෝග දරන තත්ත්වය විශාල වන නිසා, එය, සමස්ථ වර්ධන අනුපාතිකය පහත දැමීමට හේතු වී ඇත. මේ හැර, මෙම අයහපත් වර්ධනය කෘෂිකර්මය පදනම් වූ කාර්මික අංශය කෙරෙහි ද තරමක් දුරට අහිතකර බලපෑමක් ඇති කොට තිබේ. එසේ වුවද, ජාතික ආදයම කෙරෙහි සුළු කොට තැකිය නොහෙන ප්‍රමාණයකින් දයක වන වෙනත් ආශ්‍රිත සේවාවන් වර්ධනය වීමට ඇති හැකියාව පවත්වා ගැනීමට නම්, කෘෂිකර්මය සහ කර්මාන්තය වැනි මූලික අංශයන්හි ආර්ථිකයේ ක්‍රියාවලිය වඩා හොඳ විය යුතු බවට පැහැදිලි සළකුණු ඇත. අපනයනය කරනු ලබන දළ දේශීය නිෂ්පාදිත කොටස වැඩි කිරීමේ අවශ්‍යතාවයත් රටේ ගෙවුම් ශේෂ ශක්‍යතාවය පවත්වා ගැනීමෙහි ලා එහි ඇති අතිශය වැදගත්කමත් පිළිබඳව මෙහිදී විශේෂයෙන් ම සඳහන් කළ යුතුව ඇත. අපනයන සහ දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය පසුගිය වසර කිහිපය තුළදී පහත බැසීමේ උපනතියක පැවැති අතර, 1982 දී එය සියයට 23 ක් විය.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ දී, ජාත්‍යන්තර ආර්ථික වාතාවරණය නොකඩවා ශ්‍රී ලංකාව වැනි ප්‍රාථමික නිෂ්පාදන රටවල යහපතට අහිතකර තත්ත්වයක් උදකර විය. අඳුරු සහගත ලෝක ආර්ථික තත්ත්වය 1982 වර්ෂයේ දීත්, මඳකුදු අඩු නොවී පැවැති අතර, ලෝක වෙළෙඳාම සම්බන්ධයෙන් තෙවෙනි වසරටත් බොහෝ දුරටම ශූන්‍ය වූ වර්ධනයක් වාර්තා විය. ප්‍රධාන කාර්මික රටවල වර්ධන අනුපාතික, 1981 දී ඒවායේ පැවැති වර්ධන අනුපාතිකවලට පවා අඩුවෙන් පැවතිණි. ප්‍රධාන කාර්මික රටවල් 7 ක එනම්, කැනඩාව, ප්‍රංශය, ජර්මනිය, ඉතාලිය, ජපානය, එක්සත් රාජධානිය සහ ඇමෙරිකා එක්සත් ජනපදය යන රටවල, ස්ථාවර මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය 1982 වර්ෂයේ දී සියයට 0.1 ක වැඩිවීමක් පමණක් වාර්තා කළේය. මෙම රටවල් සිය පෞද්ගලිකත්වයට නැඹුරු වූ ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කිරීමේ දී, මෙම අර්බුදය සමස්ථ ලෝකයටම බලපාන්නක් වීම ගැන තැකීමක් නොදක්වන ලදී. ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය සහ කැනඩාව වැනි රටවල් කීපයක්ම දැඩි මූල්‍ය සහ ඉල්ලුම් පාලන ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමෙන් උද්ධමන අනුපාතිකයන් සාමාන්‍යයෙන්, තනි සංඛ්‍යා මට්ටමට පහත හෙළීමට සමත් වුවද, එමගින්, සේවා වියුක්ති අනුපාතිකයන් යුගල සංඛ්‍යා මට්ටමට ඉහළ නංවන ලදී. මෙහි ප්‍රතිඵලය වූයේ, ශ්‍රී ලංකාව වැනි දියුණුවන රටවල ගැටළු තවත් උග්‍ර අතට පෙරළීමට හේතුවන්නා වූ ආරක්ෂණවාදී ප්‍රතිපත්ති තව තවත් තහවුරු වීමයි. මේ කරුණත්, නිෂ්පාදන අංශයේ වර්ධනය මන්දගාමී වීමෙන් පැන නැගුණු ප්‍රාථමික භාණ්ඩ සඳහා වූ දුර්වල ඉල්ලුමත්, ප්‍රාථමික භාණ්ඩ නිෂ්පාදකයන් අතර තරඟය තීව්‍ර කිරීමට හා ප්‍රාථමික භාණ්ඩවල මිල පහළ මට්ටමකට හෙළීමට ඉවහල් විය.

ආර්ථික පසුබැස්මේ සහ සේවා වියුක්තියේ වූ දැඩි බලපෑම, 1982 දෙවන භාගය තුළදී, විශේෂයෙන් ම ඇමෙරිකා එක්සත් ජනපදයේ මූල්‍ය පාලනය ලිහිල් කිරීමට හේතු විය. ඇමෙරිකා එක්සත් ජනපදයේ පොළී අනුපාතික පහත වැටීම, ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳ පොළේ පොළී අනුපාතික වල එවැනිම පහත වැටීමකට තුඩු දුනි. එහෙත්, මෑත වසර වලදී වෙළෙඳ ණයවල

පිහිට ලැබූ ශ්‍රී ලංකාව වැනි ඇතැම් රටවල්, අඩු පොළී අනුපාතික සහ අඩු සීමා කිරීම් සහිත දැඩි මූල්‍ය ප්‍රතිපත්ති යන කරුණු දෙකෙන්ම වාසි ලැබූ නමුත්, ආරක්ෂණවාදී ප්‍රතිපත්ති ජාත්‍යන්තර ආර්ථික ක්‍රමයෙහි කැපී පෙනෙන ලක්ෂණයක් විය.

ලෝක ආර්ථිකයෙහි ඇති වූ මෙම අහිතකර ක්‍රියාදමයන්, ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය, ආයෝජනය, අපනයන සහ රජයේ ආදයම කෙරෙහි ඍජුවත්, වක්‍රවත්, අයහපත් ලෙස බල පෑවේය. බෙහෙවින් ජාත්‍යන්තර වෙළෙඳාම මත රඳා පවත්නා ශ්‍රී ලංකාව වැනි රටවල් (ශ්‍රී ලංකාවේ අපනයන හා ආනයන පිළිවෙලින් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 23 ක් සහ දළ ජාතික වියදමින් සියයට 43 කි.) මෙම අහිතකර බලපෑම්වලින් පසුබෑමට පත්විය. පොල් නිෂ්පාදනය සියයට 11 කින් කැපී පෙනෙන ලෙස වැඩිවීමෙන් ලද වාසිය, ජාත්‍යන්තර මිල ගණන් පහත වැටීම නිසා සහමුලින්ම වාගේ මැකියාම මේ පිළිබඳව දිය හැකි හොඳම නිදසුනකි. ඇත්ත වශයෙන්ම, අපනයන බදු ආදයම් 1981 දී පැවති මට්ටමට වඩා සියයට 21 කින් අඩු විය. රබර් සම්බන්ධයෙන් ද වඩාත් කැපී පෙනෙන නිදසුනක් ගෙන හැර දැක්විය හැක. අපනයන පරිමාව සියයට 17 කින් නැතහොත්, කිලෝග්‍රෑම් දශ ලක්ෂ 19 කින් වැඩිවුවද, අපනයන ආදයම සියයට 20 කින් පහත වැටී ඇත. අපනයන බදු ආදයමෙහි පහත වැටීම සියයට 47 ක් හෙවත් ඉකුත් වසරේ ආදයමෙන් අඩකට ආසන්න ප්‍රමාණයකි.

ජාත්‍යන්තර වෙළෙඳ අනුපාතයෙහි බලපෑම නොනැවතී සිව්වැනි වසරටත් අහිතකර තත්ත්වයක පැවති අතර, එය 1981 දී තිබුණු 46 සිට 1982 දී 38 දක්වා පහත වැටුණි. මේ අනුව, අයහපත් වෙළෙඳ අනුපාතය නිසා, ශ්‍රී ලංකාවට වෙළෙඳාමෙන් සිදු වූ පාඩුව 1982 දී දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 8 ක් විය. 1981 දී මෙහි පාඩුව සියයට 7 ක් විය. වෙළෙඳ අනුපාතය සඳහා ගැලපීමක් කළ පසුව, 1981 දී සියයට 3.2 කින් වැඩි වූ මූර්ත ජාතික ආදයම, 1982 දී සියයට 3.6 කින් වැඩි විය.

1982 වර්ෂයේ ආර්ථික ක්‍රියාවලියෙහි ඇති වූ ඉතා වැදගත් ලක්ෂණයක් වනුයේ, උද්ධමන වේගය සැළකිය යුතු ලෙස අඩු වීමය. පිළිවෙලින් වසර තුනක ඉහළ වැඩිවීමකින් පැවැති මිල මට්ටම්වල වර්ධන අනුපාතිකය මෙවර එක් අංකයක් දක්වා අවපාත වී ඇත. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ වාර්ෂික සාමාන්‍ය වැඩිවීමේ වේගය සියයට 10.8 ක් වූ අතර, තොග මිල දර්ශකයෙහි වැඩිවීම සියයට 5.5 ක් පමණ අඩු ප්‍රමාණයක් විය. ඉකුත් වසරේ මෙම වැඩිවීම් පිළිවෙලින් සියයට 18 ක් සහ සියයට 17 ක් විය. මෙය ඇති කරන ලද්දේ, නොයෙකුත් සාධක මගිනි. අයවැය පරතරය නිසා ඇතිවන බලපෑම අඩුකිරීමෙන් උද්ධමනය සීමා කිරීමට රජය විසින් බලවත් උත්සාහයකින් යුතුව උචිත පරිදි ප්‍රතිපත්ති සකස් කරන ලදී. ඉල්ලුම් පාලන ප්‍රතිපත්ති සාර්ථක ලෙස පවත්වා ගෙන යාමට මහ බැංකුව විසින් දැඩි මූල්‍ය ප්‍රතිපත්ති අනුගමනය කරන ලදී. ලෝකයේ පැවැති අඩු උද්ධමන වේගය නිසා සමහර ආනයනික භාණ්ඩවල මිල ස්ථාවරව පැවති අතර, එය ශ්‍රී ලංකාව අනුගමනය කරන ප්‍රතිපත්ති ස්ථාවරව පවත්වා ගෙන යාමට සෑහෙන ප්‍රමාණයකින් ආධාර විය. ලිහිල් කළ ප්‍රතිපත්ති නිසා, මුල් අවුරුදු කිහිපය තුළදී පාරිභෝගික සහනාධාර ඉවත් කිරීමත් සමඟ වූ පාලන මිල ගැලපුම බොහෝදුරට අවසන්වී ඇති අතර, අවුරුද්ද මුළුල්ලේම ස්ථාවර විනිමය අනුපාතිකයක් පැවතීම ඊට තවත් උපකාරී විය. ඇත්ත වශයෙන්ම, තිරිඟු පිටි සහ සීනි මිල වර්ෂය තුළදී පහත වැටී ඇත. වර්ෂයේ මුල් භාගයේ දී නිෂ්පාදනය පහත වැටුනද, සාපේක්ෂ වශයෙන් ස්ථාවර මිලකට ආනයනය කළ සහල් ලබාගත හැකිවීම නිසා, සහල් මිල සැළකිය යුතු ලෙස ඉහළ යාම වළක්වා ගතහැකි විය. එසේ වුවත්, මිල මට්ටම් කෙරෙහි බලපෑම ඇති කරන මූල්‍ය සහ පිස්කල් ප්‍රතිපත්ති පිළිබඳව නිරතුරුවම සෙවිල්ලෙන් සිටීමේ ප්‍රතිපත්තිය 1982 දී සිදු වූ මෙම මධ්‍යස්ථකරණය නිසා ලිහිල් කළ නොහැක. මිල මට්ටම් සම්බන්ධයෙන් ඉමහත් පරිශ්‍රමයෙන් දිනාගත් මෙම ජයග්‍රහණය ඉදිරියේදීත් රැකගැනීමට නම්, නිෂ්පාදනය, විශේෂයෙන්ම ආහාර නිෂ්පාදනය, වැඩිකිරීම සඳහා උත්සාහ දැරීම අත්‍යවශ්‍යවනු ඇත

බොහෝ දුරට මිල මට්ටම් වැඩිවීමේ අනුපාතිකය මන්දනය වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ආර්ථිකයේ සංවිධානය වූ මෙන්ම, සංවිධානය නොවූ අංශයන්හි ද මූර්ත වැටුප් වර්ෂය තුළදී ඉහළ ගියේය. 1982 ජනවාරි 01 වැනි දින සිට 'ඒකාබද්ධ වැටුප්' ක්‍රමය හඳුන්වා දීමත්, 1981 දී හඳුන්වාදුන් ජීවන වියදම් දර්ශකය මත ගෙවන දීමනාව තවදුරටත් ගෙවීමත් නිසා, රජයේ සේවකයින්ගේ නාමික වේතන ඉකුත් වසර සමඟ සසඳන කල, 1982 වර්ෂය තුළදී ඉතා වේග යෙන් ඉහළ ගියේය. අනෙක් අතට, 1981 දී සියයට 3 කින් පහත වැටුණු ඔවුන්ගේ මූර්ත වැටුප්, 1982 දී සියයට 19 කින් වැඩි විය. පඩි පාලක සභා මගින් වේතන පාලනය වන, සංවිධානය වූ පෞද්ගලික අංශයේ නාමික හා මූර්ත වැටුප් වැඩි වූ නමුදු, පෞද්ගලික අංශයේ වැටුප් වැඩිවීමේ අනුපාතිකයට වඩා රාජ්‍ය අංශයේ වැටුප් වැඩිවීමේ අනුපාතිකය ඉහළ මට්ටමක විය. දිවයින පුරා සංවිධානය නොවූ අංශයේ, සියළුම කාණ්ඩවල ස්ත්‍රී සහ පුරුෂ සේවක දෛනික වැටුප්ද, වැඩි වූ අතර, පොල් සහ වී වගා අංශයන් හි කම්කරුවන්ගේ සහ මේසන් හා වඩුකාර්මිකයන්ගේ වැටුප් වැඩිවීම මෙහිදී බෙහෙවින් කැපී පෙනුනි. මූල්‍ය වැටුප් වැඩිවීම විශාලවීම නිසා, මෙම අංශවල මූර්ත වැටුප් ද වැඩි විය.

ලබා ගත හැකි වූ දත්ත අනුව, අළුතෙන් ඇතිවූ සේවා නියුක්තිය 1982 වර්ෂයේදී යහපත් මට්ටමක පැවැති බව පෙනේ. සංවිධානය වූ අංශයෙහි එනම්, රජයේ දෙපාර්තමේන්තුවලට, අර්ධ රාජ්‍ය ආයතන වලට සහ සේවක අර්ථ සාධක අරමුදලට දායක වන පෞද්ගලික අංශයේ ව්‍යවසායවල වර්ෂය තුළ ඇති වූ නව රැකියා අවස්ථාවන්හි මුළු සංඛ්‍යාව 34,000 ක් වූ අතර, එය 1981 වර්ෂයට වඩා සුළු වශයෙන් අඩු වීමකි. 1980 සහ 1981 වර්ෂයන්හි දී මෙම සංඛ්‍යාව පිළිවෙලින් 18,035 ක් සහ 40,622 ක් විය. මෙම වැඩිවීමේ වඩා විශාල කොටස සංවිධානය වූ පෞද්ගලික අංශයෙහි සිදු වූ අතර, එම අංශයේ සේවා නියුක්ති ධාරිතාව වර්ෂය තුළදී 25,625 කින් වැඩිවිය. රාජ්‍ය අංශයේ සහ අර්ධ රාජ්‍ය ආයතනවල සේවා නියුක්තිය සාපේක්ෂ වශයෙන් නොවෙනස්ව පැවතීමෙන් පිළිබිඹු වූයේ, අයවැය ප්‍රතිපාදන සම්බන්ධයෙන් ඇති වූ අවහිරකම් සහ අර්ධ රාජ්‍ය ආයතනවලට ණය සැපයුම වැඩි කිරීම පිළිබඳව වූ සීමා කිරීමය.

සංවිධානය නොවූ පෞද්ගලික අංශයේ සේවා නියුක්ති පිළිබඳ සංඛ්‍යා තොරතුරු ලබා ගැනීමට නොමැති අතර, නිල සංඛ්‍යා තොරතුරු මෑත වසරවලදී ඇති වූ නව සේවා නියුක්ති අවස්ථා ප්‍රමාණය පිළිබඳව සම්පූර්ණ තත්ත්වය පිළිබිඹු නොකරයි. කෙසේ වුවද, මෙම අංශයේද සේවා නියුක්තිය, පසුගිය වසර කිහිපය තුළදී වැඩි වූ බව විශ්වාස කිරීමට හේතු ඇත. මෙයට හේතු කිහිපයක් ඇත. පළමුවැන්න නම්, ශ්‍රී ලංකා ආර්ථිකය එහි ස්වභාවය අනුව සහ සංවර්ධන තත්ත්වය අනුව, විශාල වශයෙන් සංවිධානය නොවූ අංශයකින් සමන්විත වීමයි. දෙවැන්න නම්, ප්‍රාථමික අංශයේ සේවා නියුක්තිය හැරුණුවිට, මෑත වසරවලදී ආර්ථික වර්ධන අනුපාතිකයන් ඉහළ යාමේ හේතුවෙන් ආදායම් ඉහළ යෑම නිසා ඇති වූ නව ආර්ථික අවස්ථාවන්හි ප්‍රතිඵලයක් වශයෙන් අනේකවිධ රැකියා අවස්ථා ඇති කරලීමයි. පෞද්ගලික ප්‍රවාහන අංශය සහ වෙළෙඳ අංශය විශේෂයෙන්ම සිල්ලර වෙළෙඳ අංශය මෙවැනි රැකියා අවස්ථාවනට උදාහරණ වේ. මෙම රැකියා අවස්ථාවන්හි මුළු ගණන නිල සංඛ්‍යා තොරතුරු වලින් පිළිබිඹු නොවේ. අනියම් සේවකයන් ලෙස සේවකයන් විශාල වශයෙන් යොදවා ගන්නා බැවින්ද, සේවකයන් එක් ආයතනයකින් තව ආයතනයකට මාරුවීමේ වේගය ඉතා ඉහළ බැවින්ද, මෙම අංශවල ව්‍යාපාරික ආයතන විශාල සංඛ්‍යාවක් සේවක අර්ථ සාධක අරමුදලට දායක නොවේ.

1978/79 හා 1981/82 පාරිභෝගික මුදල් නියැදි සමීක්ෂණයන්ගෙන් මහ බැංකුව ලබාගෙන ඇති තොරතුරු අනුව සේවා වියුක්ති අනුපාතිකය, 1973 දී පැවති මුළු ශ්‍රම බලකායෙන් සියයට 24.0 සිට 1978/79 දී සියයට 14.8 දක්වාත්, 1981/82 සමීක්ෂණයේදී ලබාගත් ඉතාමත්ම තාවකාලික ඇස්තමේන්තු අනුව සියයට 13.1 දක්වාත් පහත වැටුනු බව පැහැදිලි වේ. ද්විතීයික සහ උසස් අධ්‍යාපනය ලද පුද්ගලයන්ගේ සේවා වියුක්ති ප්‍රශ්නය බොහෝ දුරට සමනය වී ඇති බව මෙම සමීක්ෂණය තවදුරටත් හෙළි කරයි.

මිල වැඩිවීමේ අනුපාතිකයන් මන්දනයවීම සහ සියළුම අංශයන්හි සේවා නියුක්තිය සහ වේතන වැඩි වීම සැළකිය යුතු ලක්ෂණ වූ අතර, දේශීය වශයෙන් ඉතිරි කිරීම් ඇති කිරීමට ආර්ථිකයට ඇති හැකියාව අභිබවා යමින්, ආයෝජන ද විශාල වශයෙන් වැඩිවිය. මෙම ඉහළ ආයෝජන මට්ටම සීමිත වූ මූර්ත සහ මූල්‍ය සම්පත් ඇති ආර්ථිකයකට සාමාන්‍යයෙන් නොගැලපෙන නිසා, මෙහි ප්‍රතිඵලය වශයෙන් 1982 දීද ආයෝජන ඉහළ මට්ටමක පවත්වා ගැනීම සඳහා විදේශීය ඉතිරි කිරීම්වලට විශාල කාර්ය භාරයක් ඉටු කිරීමට සිදු විය. 1982 දී දේශීය ඉතිරි කිරීම් රුපියල් කෝටි 1,210 ක් නැතහොත් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 12.1 ක් වූ අතර, 1981 දී එය රුපියල් කෝටි 990 ක් විය. අනෙක් අතට, ආයෝජන රුපියල් කෝටි 3,050 ක් හෙවත් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 30 ක් ලෙස ගණන් බලා ඇත. දේශීය ඉතුරු කිරීම් අනුපාතයේ සුලු වැඩිවීමක් දක්නට ලැබුනද, එය පවත්නා වෙළෙඳ මිල ගණන් අනුව දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 30 ක පමණ පවතින ආයෝජන මට්ටම සමඟ බලන කල තවමත් අසතුටුදයක පහළ මට්ටමක පවතී. විදේශ රැකියාවන්හි නියුක්තව සිටින ශ්‍රී ලාංකිකයන් විසින් විශාල වශයෙන් ලංකාවට මුදල් එවීමේ ප්‍රතිඵලයක් වශයෙන්, විදේශීය ශුද්ධ පෞද්ගලික සංක්‍රාම ශීඝ්‍රයෙන් වැඩිවීම නිසා ජාතික ඉතිරිකිරීම් එම මට්ටමේම රඳවා ගැනීමට හැකි විය. දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් ගත් කල ජාතික ඉතිරි කිරීම් වැඩිවීම ශීඝ්‍ර වූ අතර 1982 දී එය සියයට 15.3 ක් විය.

### 1 · 3 සංඛ්‍යා සටහන
### ආයෝජන–ඉතිරි කිරීම් 1978—1982
(වෙළෙඳ මිල යටතේ වූ ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස)

| ශීර්ෂය | 1978 | 1979 | 1980* | 1981* | 1982* |
|---|---|---|---|---|---|
| දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය .. | 20.0 | 25·3 | 31·3 | 27·4 | 30·1 |
| රජයේ1 .. | 7·2 | 7·3 | 7·1 | 4·9 | 5·0 |
| පෞද්ගලික (රජයේ සංස්ථාවන්ද ඇතුළත්ය) .. | 12·8 | 18·0 | 24·2 | 22·5 | 25·1 |
| තොග වෙනස්වීම් .. | 0·1 | 0·5 | 2·4 | 0·4 | 0·2 |
| මුළු ආයෝජනය= | | | | | |
| මුළු ඉතිරිකිරීම් (දේශීය හා විදේශීය) .. | 20·1 | 25·8 | 33·7 | 27·8 | 30·3 |
| දළ දේශීය ඉතිරිකිරීම් .. | 15.5 | 14·8 | 14·0 | 14·3 | 15·3 |
| රජයේ .. | –1.4 | 0·2 | – 3·8 | – 1·7 | –1·7 |
| පෞද්ගලික .. | 16·9 | 14·6 | 17·8 | 16·0 | 17·0 |
| විදේශීය ඉතිරිකිරීම්2 .. | 4·5 | 11·1 | 19·8 | 13·5 | 15·1 |
| ශුද්ධ අනුග්‍රාහී ආධාර3 .. | 9·2 | 8·5 | 8·4 | 9·2 | 8·3 |
| සංචිත උපයෝජනය .. | – 4·4 | – 1·5 | 4·5 | 0·5 | 1·1 |
| ශුද්ධ වෙළෙඳ ණය ගැනීම් .. | – 1.0 | 2·1 | 4·9 | 3·5 | 4·9 |
| අනෙකුත් (ශුද්ධ)4 .. | 0·7 | 2·0 | 2·0 | 0·3 | 0·8 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* තාවකාලික

1. ශුද්ධ අයවැයමය ප්‍රාග්ධන වියදම්
2. ගෙවුම් ශේෂයේ ජංගම ගිනුමේ හිඟයට හා ශුද්ධ පෞද්ගලික සංක්‍රාමයන්ට සමානය.
3. ජා. මු. අ. භාරකාර අරමුදල, අනුග්‍රාහී ණය හා දීමනා ඇතුළත්ය.
4. ඍජු විදේශීය ආයෝජන, වි. ගැ. හි. වෙන්කිරීම සහ වැරදීම හා අත්හැරීම් ඇතුලත්ය.

1.3 සංඛ්‍යා සටහනෙහි දැක්වෙන අයුරු, දේශීය ඉතිරි කිරීම් සහ ආයෝජනය අතර ඇති විශාල පරතරය ඉහතදී මෙන්ම, පැහැදිලි ලෙසට තවදුරටත් විදේශීය ඉතිරි කිරීම් මගින් පියවිය යුතු විය. කෙසේ වුවද, මෑත වර්ෂවලදී ලැබුනු සහනදායී ශුද්ධ ආධාර ප්‍රමාණය පහළ වැටීණි. එම නිසා හිඟය පියවීම සඳහා පිරිවැය අධික වෙළෙඳ ණයවල පිහිට ලබා ගැනීමට මෙන්ම, රටේ සංචිත ප්‍රමාණය අඩුවී යන පරිදි කටයුතු කිරීමටත් සිදුවිය. වෙළෙඳ ණය උපයෝජනයේදී සහ සංචිත අඩුවී යන පරිදි කටයුතු කිරීමේදී පැහැදිලි සීමාවන් ඇති බැවින්,

එකී තත්ත්වය තව දුරට පවත්වාගෙන යාම විදේශාධාර නොකඩවා ලැබීම මත දැඩි ලෙස රඳා පවතිනු ඇත. වත්මන් අඳුරු ලෝක ආර්ථික තත්ත්වය යටතේ සහනදායී විදේශාධාර බලාපොරොත්තු විය නොහැකි බැවින්, මිල මට්ටම් සහ ගෙවුම් ශේෂය කෙරෙහි අහිතකර බල පෑමක් ඇති නොකර දේශීය ආයෝජන පවත්නා මට්ටමේ තවදුරටත් රඳවා තැබීමට නම්, දේශීය ඉතිරි කිරීම් අනුපාතය වැඩිකර ලීමට නොනවත්වා ප්‍රයත්න දැරිය යුතුව ඇත.

දේශීය ඉතිරි කිරීමේ අනුපාතයෙහි වැඩිවීමක් සිදුවීමට කාලයක් මුළුල්ලේම අසමර්ථවීම දෙස බැලිය යුතුව ඇත්තේ, විශාල වශයෙන්ම 1978 සිට වෙළෙඳ අනුපාතයේ ඇති වූ පිරිහීම හේතුකොට ගෙන වූ ඒක පුද්ගල දළ දේශීය ආදායමෙහි අඩු වාර්ෂික වර්ධනය මත පිහිටා සිටය. ඉහළ මූල්‍ය පොළී අනුපාතවලට අවශ්‍ය ලෙස ප්‍රතික්‍රියා දක්වමින්, කාලීන සහ ඉතිරි කිරීමේ තැන්පතු ප්‍රමාණයන් ඉහළ යාම, මූල්‍ය ඉතිරි කිරීම්වල වර්ධනයක් ඇති කරවීම සඳහා අනුගමනය කළ ප්‍රතිපත්ති විශාල ලෙස සාර්ථක වූ බව පෙන්වයි. එසේ වුවද, ඒකාබද්ධ ලෙස ගත් කල මූල්‍ය ඉතිරි කිරීම් එක් රැස් කොට සමස්ත ඉතිරි කිරීම් දිරි ගැන්වීම සඳහා යෙදූ ප්‍රතිපත්තීන්, පටු අරුතින් ගත් කල සාර්ථක වුවද, වෙනත් අංශවල ඉතිරි කිරීම් අඩු වීම නිසා යටපත් වූ බව පෙණේ.

දේශීය ඉතිරි කිරීම් වැඩි කිරීම සඳහා වූ ප්‍රයත්නයට සිය වර්තන ගිණුමෙහි අතිරික්තයක් ජනිත කිරීම මගින් රජය විසින් කළ යුතු දායකත්වය මෑත වර්ෂවලදී ප්‍රතිවිරුද්ධ ලෙස සිදුවීම සැළකිය යුතු කරුණකි. සැළසුම් ගත සහනාධාර ඉවත් කර ගැනීමක් ලෙස සිදු කළ මෙම උත්සාහයේ ප්‍රතිඵල මෙතෙක් ලැබී නොමැත. අපනයන බදු ආදායම් මත වැඩි වශයෙන් රඳා පවත්නා රජයේ ආදායම කෙරෙහි ජාත්‍යන්තර ආර්ථික වාතාවරණය තදබල හානි පැමිණවූ බව සත්‍ය තත්ත්වයකි. විනිමය අනුපාතිකය වෙනස් නොකර, බදු අඩු කිරීම මගින් නිෂ්පාදන සානුබලය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය රජයේ ඉතිරි කිරීම් උත්පාදනය කිරීමේ හැකියාව කෙරේ විශාල බලපෑමක් ඇති කළේය. එසේ වුවද, 1978 සිට ශ්‍රී ලංකාවේ විශාල වශයෙන් ආයෝජන වැඩි වී ඇත. එහෙත්, ආර්ථික පොදු කාර්‍ය පහසුකම් සහිත ව්‍යාපෘතීන් හි යොදවන ලද එකී ආයෝජනවලින්, සෘජුවම වාසි ලබන්නන් රජයේ ආදායමට තමන් විසින් කළ යුතු දායකවීම කළ යුතුව ඇත. ජාතික ඉතිරි කිරීමේ ප්‍රයත්නයට රාජ්‍ය අංශය සිය කොටස ලබා දී යථා පරිදි දායක වීමට නම් එම කාර්යය අත්‍යවශ්‍ය වන්නේය. මේ සම්බන්ධයෙන් සළකන විට අපනයන බදු ආදායම ඉවත් කොට ගණන් බැලීමේ දී වුවද, රජයේ ආදායම වෙළෙඳ පොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදන ප්‍රතිශතයක් වශයෙන් ගත්කල පිරිහීමේ උපනතියක් දක්වන බව සටහන් කළයුතුව ඇත.

දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය (ද.දේ.ප්‍රා.) සහ දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය (ද.දේ.ස්ථා. ප්‍රා.) යන දෙඅංශයම පිළිවෙලින් සියයට 29 සහ සියයට 30 බැගින් වැඩිවීම් වාර්තා කරන ලදී. පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය සංස්ථාවල දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන වැඩිවීමේ අනුපාතය, රාජ්‍ය අංශයේ ද.දේ.ස්ථා.ප්‍රා. වැඩිවීමේ අනුපාතයට වඩා වැඩි විය. පළමුවැන්න සියයට 32 කින් වැඩි වූ අතර, පසුව සඳහන් කළ රාජ්‍ය අංශයේ වැඩිවීම සියයට 21 ක් විය. 1982 දී ප්‍රාග්ධන භාණ්ඩ ආනයනයේ සැළකිය යුතු වැඩිවීමක් විය. නැව් සහ ගුවන් යානා ආනයනය මෙහි වැදගත් කොටසක් වූ අතර, එමගින් ද.දේ.ස්ථා.ප්‍රා. යේ ආනයන කොටස 1981 දී සියයට 32 ක සිට 1982 දී සියයට 37 ක් දක්වා වැඩි විය.

දළ දේශීය නිෂ්පාදිතය සහ භාණ්ඩ සහ සාධක නොවන සේවා ආනයනය යන කොටස්-වලින් සමන්විත රටෙහි පවත්නා මුළු සම්පත් ප්‍රමාණය 1978 මිල ගණන් අනුව 1982 දී සියයට 4.1 කින් වැඩි විය. 1981 දී එහි වාර්තා වූ වර්ධනය සියයට 5.1 ක් විය. භාණ්ඩ සහ සාධක නොවන සේවා ආනයනයේ අනුපාතිකය අඩු වීම නිසා ආර්ථිකය සඳහා ලබා ගත හැකි වූ සම්පත් ප්‍රමාණය පෙර වසරේ මෙන් අඩු වූ අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් දේශීය නිෂ්පාදන කොටසට අයත් සම්පත්හි සුළු වැඩිවීමක් සිදු විය. උපයෝජනය පැත්තෙන් බලන කල පරිභෝජනය 1981 දී වූ අනුපාතිකයට වඩා අඩු අනුපාතයකින් ඉහළ ගියද එය තවමත් සියයට 61 ක ප්‍රමාණයක් අවශෝෂණය කළේය. තවද, දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය සහ අපනයන කටයුතු, ආර්ථිකයෙහි පැවති මුළු සම්පත්වලින් පිළිවෙලින් සියයට 18 ක් සහ සියයට 21 ක් උපයෝජනය කරන ලදී.

## 1·4 සංඛ්‍යා සටහන
## මූල්‍ය සමස්තයන් 1977—1982

රුපියල් දශ ලක්ෂ

| | 1977 | 1978 | 1979 | 1980 | 1981 | 1982 |
|---|---|---|---|---|---|---|
| දේශීය ණය වෙනස්වීම | 1,464 | 1,662 | 3,624 | 11,286 | 8,330 | 8,483 |
| රජයට දෙන ලද ශුද්ධ ණය වැඩිවීම .. .. | – 278 | –1,126 | 1,057 | 6,052 | 3,817 | 4,361 |
| රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය වැඩිවීම .. .. | 115 | 193 | 984 | 776 | 365 | 190 |
| සමුපකාර අංශයට දෙන ලද ණය වැඩිවීම .. .. | 509 | 205 | – 439 | – 86 | 93 | – 54 |
| අනෙකුත් පෞද්ගලික අංශයට දෙන ලද ණය වැඩිවීම .. .. | 618 | 1,890 | 2,022 | 4,544 | 4,055 | 3,986 |
| බැංකු විදේශීය වත්කම් (ශුද්ධ) වෙනස්වීම .. .. | 3,597 | 1,884 | 1,218 | –3,177 | – 690 | – 568 |
| මුළු වත්කම් සහ වගකීම් වෙනස්වීම .. .. | 5,061 | 3,546 | 4,842 | 8,109 | 7,640 | 7,915 |
| පුළුල් මුදල් සැපයුම වැඩිවීම .. .. | 2,396 | 2,175 | 4,166 | 4,803 | 4,587 | 6,063 |
| අනෙකුත් වගකීම් (ශුද්ධ) වැඩිවීම .. .. | 2,665 | 1,371 | 676 | 3,306 | 3,053 | 1,852 |

### මූල්‍ය සමස්තයන් වැඩිවීමෙහි ප්‍රතිශතය

| | 1977 | 1978 | 1979 | 1980 | 1981 | 1982 |
|---|---|---|---|---|---|---|
| දේශීය ණය වැඩිවීමේ ප්‍රතිශතය .. .. | 20·2 | 19·1 | 35·0 | 80·7 | 33·0 | 25·3 |
| මුළු වත්කම් සහ වගකීම් වැඩිවීමේ ප්‍රතිශතය | 66·4 | 28·0 | 29·9 | 38·5 | 26·2 | 21·5 |
| දේශීය ණය වැඩිවීමෙහි රජයේ කොටස ප්‍රතිශතයක් වශයෙන් .. .. | – 19·1 | – 67·8 | 29·2 | 53·7 | 45·9 | 51·5 |
| දේශීය ණය වැඩිවීමෙහි රාජ්‍ය නොවන කොටස ප්‍රතිශතයක් වශයෙන් .. | 119·1 | 167·8 | 70·6 | 46·3 | 54·1 | 48·5 |
| පුළුල් මුදල් සැපයුම වැඩිවීමෙහි ප්‍රතිශතය .. .. | 38·0 | 25·0 | 38·3 | 31·9 | 23·1 | 24·8 |
| පටු මුදල් සැපයුම වැඩිවීමෙහි ප්‍රතිශතය .. .. | 28·8 | 10·6 | 29·2 | 22·9 | 6·3 | 17·3 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

1980 දී වර්ධනය වූ අසමතුලිතතාවය ඉවත් කරලීම සඳහා විශාල ලෙස උපකාරී වූ පියවරක් ලෙස 1981 දී යොදගත් ඉල්ලුම් පාලන ප්‍රතිපත්ති මාලාව සමාලෝචනයට භාජනය වන වසරේදී ද අඛණ්ඩව පවත්වාගෙන යනු දක්නා ලදී. 1982 මූල්‍ය පාලනයෙහි දක්නට ලැබූ වැදගත් ලක්ෂණය වූයේ වසර තුළ පවත්වාගෙන යන ලද මූල්‍ය සහ මිල ස්ථාවර භාවයයි. දේශීය ණයවල වඩාත් මන්දගාමී ලෙස ඇති වූ වර්ධනයෙන් විදේශ බැංකු වත්කම්හි (ශුද්ධ) වූ අඩුවීමේත් ප්‍රතිඵලය වූයේ සමාලෝචනයට භාජනය වූ වසරේදී පුළුල් ලෙස ඉලක්ක කර ගත් අන්දමට මූල්‍ය වර්ධනය සිදුවීමයි. 1980 දී සියයට 81 කින් ප්‍රසාරණය වූ දේශීය ණය 1981 දී සියයට 33 දක්වා අඩු වී තවදුරටත් එය සියයට 25 දක්වා 1982 දී අඩු විය. මූල්‍ය ප්‍රසාරණයට ප්‍රධාන අනුබලය ලැබුනෝ රජය සහ පෞද්ගලික යන දෙඅංශයටම දෙන ලද දේශීය ණය මගිනි. එහෙත් මේ දෙඅංශයටම ලැබුණු ණයවල ක්‍රම ක්‍රමයෙන් සිදු වූ මන්දගාමීත්වයක්ද පෙන්නුම් කළේය.

ශුද්ධ විදේශීය බැංකු වත්කම් අඩුවීමෙන් දේශීය ණය වැඩිවීමෙහි ප්‍රසාරණාත්මක බලපෑම තරමක් දුරට සමහන් විය. 1980 දී හා 1981 දී පිළිවෙලින් රුපියල් දශලක්ෂ 3,177 කින් හා රුපියල් දශ ලක්ෂ 690 කින් අඩු වූ මෙම වත්කම් මෙවර රුපියල් දශ ලක්ෂ 569 කින් නැවතත් අඩු විය. දේශීය ණය වැඩිවීමෙන් උද්ගත වූ අහිතකර මූල්‍ය ප්‍රතිවිපාක සමහන් කිරීමට, විදේශීය බැංකු වත්කම් අඩුවීම උපකාරී වුවද, එමගින් ගෙවුම් ශේෂය මත වැඩි පීඩනයක් ඇති විය. 1981 දී සියයට 23 ක වැඩිවීමක් පෙන් වූ පුළුල් මුදල් සැපයුම ($M_2$) මෙකී වෙනස්වීම් පිළිබිඹු කරමින්, සියයට 25 කින් ඉහළ ගියේය. එහෙත්, ඉකුත් වර්ෂයේ දී සියයට 6 ක ඉතා සුළු වැඩිවීමක් පෙන් වූ පටු මුදල් සැපයුම ($M_1$) සියයට 17 කින් ඉහළ ගියේ ය.

වෙළෙඳ බැංකු කටයුතුවල ප්‍රධාන ලක්ෂණය වූයේ, බැංකුවල ද්‍රවශීලතා මට්ටම දියුණු වීමයි. 1981 වර්ෂයේ අවසන් භාගයේ පටන් බැංකු ද්‍රවශීලතාවයෙහි දක්නට ලැබුණ සැළකිය යුතු වර්ධනය සමාලෝචිත වර්ෂය තුළ දී ද නොකඩවා පැවතිණි. වර්ෂයේ මැද හරියේ දී තැන්පතු සඳහා පොළී අනුපාතිකයන් සියයට 2-5 අතර ප්‍රමාණයන්ගෙන් අඩු කිරීමෙන් බැංකු ක්‍රමය, වැඩි වූ ද්‍රවශීලතාවයට ප්‍රතිචාරය දැක්වීය. කෙසේ වුවද, බැංකුවලට දෙනු ලබන මහ බැංකු ණය සඳහා වූ පොළී අනුපාතික, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තැන්පතු සඳහා ගෙවනු ලබන පොළී අනුපාතික හා රජය මගින් නිකුත් කෙරෙන රුපියල් සුරැකුම්පත් සඳහා වූ පොළී අනුපාතික වෙනස් නොවීය.

1982 දී ප්‍රධාන මූල්‍ය විචලායයන් හි වූ වැඩිවීම සාමාන්‍ය තත්ත්වයක පැවති බැවින්, කැපී පෙනෙන සුළු මූල්‍ය ප්‍රතිපත්තිමය වෙනස්කම් අවශ්‍ය නො වීය. මිල වැඩිවීමේ වේගය පහත වැටී තිබියදීත්, කලින් වර්ෂවලදී පනවනු ලැබ, තිවූ කැරුණු ප්‍රතිපත්තිමය පියවරවල් සමාලෝචිත වර්ෂය තුළදී, එලෙසින්ම ක්‍රියාත්මක කරනු ලැබිණි. සියයට 14 ක් වූ මහ බැංකු පොළී අනුපාතිකයෙහි හෝ එම අනුපාතිකය යටතේ දෙන ලද ණය සීමාව ඉක්මවා දෙනු ලබන ණය වෙනුවෙන් අය කෙරෙන සියයට 21 හා සියයට 30 අතර වූ දණ්ඩන පොළී අනුපාතිකයන්ගේ හෝ වෙනසක් නොවිණි. වර්ෂය තුළදී ඉල්ලුම් තැන්පතු සඳහා වූ සියයට 14 රේ හා කාලීන හා ඉතිරිකිරීම් තැන්පතු සඳහා වූ සියයට 6 යේ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවයන් ද නොවෙනස්ව පැවතිණි. අනෙක් අතට, මූල්‍යමය ප්‍රතිපත්ති මගින් ආර්ථිකයෙහි සැපයුම ශක්තිමත් කිරීමේ අදහස ඇතිව, ප්‍රමුඛතා අංශයන් හි අධික පොළී අනුපාතිකයන් යෙදීමෙන් සිදුවන අහිතකර බලපෑම් සමහන් කිරීමට ප්‍රයත්න දරන ලදී.

අපනයන අංශයට ප්‍රමාණවත් අන්දමින් මැදි හා දිගුකාලීන ණය ලැබෙන බවට සහතික වීමේ හා විවිධ ව්‍යාපෘති සඳහා මුදල් යෙදවීමේ ලා වෙළෙඳ බැංකු වැඩි වැඩියෙන් ක්‍රියාශීලීව සහභාගිවීමේ අවශ්‍යතාවය පෙනී ගියේය. අපනයන ව්‍යාපෘතීන් සඳහා මහ බැංකුවේ මැදි හා දිගුකාලීන ණය අරමුදලින් සැපයෙන ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණය, එවැනි ව්‍යාපෘතියක පිරිවැයෙන් සියයට 80 සිට 1982 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි, ව්‍යාපෘතියේ මුළු පිරිවැය ආවරණය වන අයුරින් වැඩි කරන ලදී. ප්‍රතිමූල්‍ය මෙන්ම, ණයදීම් සඳහා පොළිය ද

UNIVERSITY OF MORATUWA LIBRARY

සුළු වශයෙන් පහත හෙළනු ලැබීය. සියයට 12 සහනදායක අනුපාතිකය මත පූර්ව–නැවගත-කිරීම් ණය සඳහා දෙන ලද ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණය ද සුළු වශයෙන් වැඩි කරන ලදී. එසේ වුවද, මහ බැංකුව පිළිවෙලින් දෙවැනි වසරටත් ක්‍රියාත්මක කරගෙන ගිය ජාතික ණය සැළැස්මෙහි 1982 ඉලක්කයන් සපුරාලීමට මෙම අංශයෙහි ණය වර්ධනය අපොහොසත් විය.

ග්‍රාමීය ණය ප්‍රමාණයෙහි පහත වැටීම මහ බැංකුවේ දැඩි කනස්සල්ලට හේතු වූ විකාශනයන්ගෙන් එකක් විය. වසර තුළ දී ග්‍රාමීය අංශයට දෙන ලද මුළු ණය ප්‍රමාණය සියයට 2 කින් මඳ වශයෙන් පහත වැටිණි. කෙසේ වුවද, සපිරි ග්‍රාමීය ණය ක්‍රමය (ස.ග්‍රා.ණ.ක්‍ර.) යටතේ මහජන බැංකුව, ග්‍රාමීය බැංකු, ලංකා බැංකු උප කාර්යාල හා හැටන් නැෂනල් බැංකුව විසින් දෙනු ලබන ණයත්, එම ආයතන විසින් ග්‍රාමීය අංශයට දෙනු ලබන වෙනත් ණයත්, මෑත වර්ෂ වලදී ග්‍රාමීය අංශයෙහි ක්‍රියාවලීන් හි දක්නට ලැබුණු දියුණුවට සරිලන අන්දමින් වර්ධනය වූ බවක් නො පෙනේ. මෙම තත්ත්වයෙන් පෙන්නුම් කැරෙනුයේ, අධික වියදම් සහිත වෙනත් මාර්ගවලින් ණය ගැනීමට තුඩු දුන් බවකි.

අධික ලෙස ණය පැහැර හැරීම් සිදුවීමද, ණය අඩුවීමට හේතුවක් විය. ණය පැහැර හැරීම ග්‍රාමීය ණය අංශයේ දිගින් දිගටම පවත්නා අයහපත් ලක්ෂණයක් වෙයි. 1981/82 වගා වර්ෂය තුළ ගෙවන ලද ප්‍රමාණයෙන් 1982 වර්ෂය තුළ ආපසු ලැබී ඇත්තේ අඩකට මඳක් වැඩි ප්‍රමාණයක් පමණි. ගොවීන් බොහෝ දෙනෙකුට ණය ආපසු ගෙවීම සම්බන්ධයෙන් නියහය බලවත් තර්ජනයක් වූ අතර, එය කාර්යක්ෂම වගා රක්ෂණ ක්‍රමයක අවශ්‍යතාවය අවධාරණය කොට දැක්විය. මේ අතර, ණය ලබාගැනීමට නුසුදුස්සන් වීමේ හේතුවෙන් ග්‍රාමීය අංශයේ ණය අඩුකිරීමට සාධක වූ ණය පැහැර හැරියවුන් පුනරුත්ථාපනය කිරීම මහ බැංකුවේත්, ග්‍රාමීය ණය උපදේශක මණ්ඩලයේත්, අවධානයට ලක් විය. සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ 1977 ජනවාරි සිට 1981 ජූනි 30 දක්වා දෙන ලද වගා ණය නැවත කාලයකට දීර්ඝ කිරීමේ ක්‍රමය ග්‍රාමීය ණය උපදේශක මණ්ඩලය විසින් කලින් වර්ෂයේදී ආරම්භ කරන ලදී. මෙම ක්‍රමය යටතේ ණය ඒකාබද්ධ කර ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කිරීමේ කාර්යය 1982 දී ලංකා බැංකුව විසින් ආරම්භ කරන ලදී. මහජන බැංකුව විසින් මෙම ක්‍රමය තවමත් ක්‍රියාත්මක කොට නො මැත. ග්‍රාමීය ණය දීමට සම්බන්ධව කටයුතු කරන රාජ්‍ය බැංකු දෙක මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීමට සංවිධානාත්මක ප්‍රයත්නයක නොයෙදුණහොත්, වුවමනාවෙන්ම ණය පැහැර හැරියවුන් නොවූ ණය අවශ්‍ය ගොවීන් කොටසකට ඉදිරියේ දී ණය ලබාගැනීමට නොහැකිවනු ඇත.

1982 වසරේ දී නව කොටස් නිකුතුන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළෙඳ පොළෙහි ක්‍රියාකාරිත්වය ඉහළ මට්ටමක පැවතිණි. 1982 වසර තුළ දී රුපියල් දශලක්ෂ 371 ක වටිනාකමට නව කොටස් නිකුතුන් 19 ක් කර තිබිණි. කලින් වසරේදී කොටස් නිකුතුන් ගණන 13 ක් වූ අතර, එහි වටිනාකම රුපියල් දශ ලක්ෂ 285 ක් විය. 1982 දී වැඩියෙන්ම නව කොටස් නිකුත් කරන ලද්දේ හෝටල් සහ සංචාරක අංශයයි. ඊළඟට වැඩිම ආයෝජනයන් සිදුවූයේ, ඉංජිනේරු, මෝටර් හා කර්මාන්ත යන අංශවලය. පුළුල් පදනමකින් යුත් සමාගම් අයිතියක් සඳහාත්, ආයෝජක සහභාගිත්වය වැඩිකිරීම සඳහාත්, සැළසුන අයබදු දිරිගැන්වීම්වල ප්‍රතිඵල පෙනෙන්නට පටන්ගෙන තිබුණු බවට සාධක තිබිණි. 1981 දී මෙන් මූලික නිකුතු වෙළෙඳ පොළෙහි ක්‍රියාවලිය උච්චාවස්ථාවට නැඟුණේ, ආදායම් බදු වර්ෂයේ අවසන් කාර්තුව හා සමවන වසරේ මුල් කාර්තුව තුළදී ය. කොටස් සියල්ලම පාහේ නිකුත් කරන ලද්දේ, මෙම කාලය තුළදී ය. 1982 දෙසැම්බර් මාසයේ දී ඉදිරිපත් කැරුණ නිකුතුන් තුනක් හැරෙන්නට අනෙක් සමාගම් 16 යේ ලැයිස්තු වසර අවසාන වන විට වසනු ලැබීය. ඒ ඒ ලැයිස්තුව වැසීමට මත්තෙන් නිකුතුන් බොහොමයකම දායකවීම් සම්පූර්ණවී හෝ ප්‍රතිරක්ෂිතව තිබිණි. නව කොටස් නිකුතු ප්‍රමාණය වැඩිවීමත්, පවත්නා සමාගම්වල පදනම පුළුල් කරනු ලැබීමත්, වසර ගණනාවක්ම අචලව තිබුණු ප්‍රාග්ධන වෙළෙඳපොළ පණගැන්වීමේ ඇති දැඩි අවශ්‍යතාවය පෙන්නුම් කරයි.

වසර තුළදී මූල්‍ය ව්‍යාප්තිය සාමාන්‍ය තත්ත්වයකින් පැවතුණේ මූල්‍ය ප්‍රතිපත්තීන් දිගින් දිගටම දැඩිව පවත්වාගෙන යාමේත් අයවැය කටයුතුවල ප්‍රසාරණාත්මක බලපෑම අඩුවීමේත් හේතුවෙනි. අයවැය පියවීම සඳහා බැංකු ණය ගැනීම, 1981 දී රුපියල් දශ ලක්ෂ 3,917 ක් වූ අතර, 1982 දී එය රුපියල් දශ ලක්ෂ 4,006 දක්වා සුළු වශයෙන් වැඩි විය. එහෙත්, දළ දේශීය නිෂ්පාදිතයෙහි අනුපාතයක් වශයෙන් බැංකු ණය ගැනීම් 1981 දී සියයට 4.6 ක් වූ මට්ටමේ සිට සමාලෝචිත වර්ෂයේ දී සියයට 4 දක්වා පහත වැටිණි. කෙසේ වුවද, 1982 දී අයවැයෙහි ප්‍රසාරණාත්මක බලපෑම අඩු විය. එයට බොහෝ දුරට හේතු වූයේ වසර තුළ දී මුදල් ශේෂ ගොඩ නැඟී තිබීම ය. මෙසේ වුවද, 1981 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 17.5 ක් වූ මුළු අයවැය හිඟය 1982 දී සියයට 20.2 දක්වා ඉහළ නැංගේය. සියයට 23 ක් වූ වියදම් වැඩිවීම, සියයට 10 ක් වූ මුළු ආදයමෙහි වැඩිවීමට වඩා ඉතා විශාලවීම මෙයට හේතු විය. දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් වශයෙන්, 1981 දී සියයට 19 ක්වූ ආදයම 1982 දී සියයට 18 දක්වා පහත වැටිණි. මෙය ඉකුත් දශකය තුළ වූ අඩුම අනුපාතයයි. එසේ වුවද, වර්ෂය තුළ දී වියදම, විශේෂයෙන්ම, ප්‍රාග්ධන වියදම, අයවැය ගත ප්‍රමාණයට වඩා බෙහෙවින් අඩු මට්ටමක පැවතිණි. ජනාධිපති ඡන්දය හා ජනමත විචාරණය මත පැවති අවිනිශ්චිතතාවය මෙම තත්ත්වයට හේතු වූවා විය හැකි ය.

### 1 · 5 සංඛ්‍යා සටහන
### රාජ්‍ය මුදල් කටයුතුවල විශාලත්වය

රුපියල් දශ ලක්ෂ

| | 1977 | 1978 | 1979 | 1980 | 1981 | 1982* |
|---|---|---|---|---|---|---|
| ආදයම | 6,686 | 11,688 | 12,730 | 14 068 | 16,228 | 17,809 |
| වියදම | 9,760 | 18,853 | 21,521 | 30,343 | 31,094 | 38,097 |
| පුනරාවර්තන වියදම් අත්තිකාරම් ගිණුම් ඇතුළුව | 6,578 | 12,239 | 12,531 | 16,489 | 17,721 | 19 230 |
| වර්තන ගිණුම් හිඟය – / අතිරික්තය + | + 108 | – 551 | + 200 | – 2,421 | – 1 493 | – 1,421 |
| ප්‍රාග්ධන වියදම් | 3,182 | 6,614 | 8,991 | 13,854 | 13,373 | 18,867 |
| සමස්ත අයවැය හිඟය | 3,074 | 7,165 | 8,791 | 16,274 | 14,866 | 20,289 |
| පියවීම | | | | | | |
| විදේශීය | 1,779 | 4,454 | 4,237 | 6,735 | 8,208 | 9,270 |
| දේශීය, බැංකු–නොවන | 2,009 | 2,486 | 3,902 | 2,484 | 2,779 | 7,248 |
| දේශීය, බැංකු | – 224 | 167 | 680 | 7,126 | 3,917 | 4,006 |
| මුදල් ශේෂ ප්‍රයෝජනයට ගැනීම | – 492 | 58 | – 28 | – 72 | – 38 | – 235 |
| **(ද. දේ. නි. යේ ප්‍රතිශතයක් ලෙස 1977–1982)** | | | | | | |
| ආදයම | 18·4 | 27·4 | 24·3 | 21·1 | 19·1 | 17·8 |
| වියදම් | 26·8 | 44·2 | 41·1 | 45·6 | 36·6 | 38·0 |
| පුනරාවර්තන වියදම් අත්තිකාරම් ගිණුම් ඇතුළුව | 18·1 | 28·7 | 23·9 | 24·8 | 20·8 | 19·2 |
| වර්තන ගිණුම් හිඟය – / අතිරික්තය + | + 0·3 | – 1·3 | + 0·4 | – 3·6 | – 1 8 | – 1·4 |
| ප්‍රාග්ධන වියදම | 8·7 | 15·5 | 17·2 | 20 8 | 15·7 | 18·8 |
| සමස්ත අයවැය හිඟය | 8·4 | 16·8 | 16·8 | 24·5 | 17·5 | 20·2 |
| පියවීම | | | | | | |
| විදේශීය | 4·9 | 10·4 | 8·1 | 10·1 | 9·7 | 9·2 |
| දේශීය, බැංකු–නොවන | 5·5 | 5·8 | 7·4 | 3·7 | 3·3 | 7·2 |
| දේශීය බැංකු | – 0·6 | 0·4 | 1·3 | 10·7 | 4·6 | 4·0 |
| මුදල් ශේෂ ප්‍රයෝජනයට ගැනීම | – 1·4 | 0·1 | – 0·1 | – 0·1 | – ··· | – 0·2 |

* තාවකාලික. මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

සමස්තයක් වශයෙන් සළකන කල, 1981 දී පෙන්නුම් කළ වර්ධනය තරමක පසුබෑමකට හසුවූ බවක් රජයේ අයවැය කටයුතුවලින් පිළිබිඹු විය. මෙම පසුබෑම බොහෝ දුරටම ජාත්‍යන්තර පසුබිමෙහි අසතුටුදායක වර්ධනයන් හේතුකොට ගෙන ඇති වූයේ වුවද, එය, රජයේ ආදයම හා විදේශාධාර ලැබීම් අපේක්ෂිත මට්ටමට වඩා පහත හෙළීමකට හේතු විය. නියත වශයෙන්, ලැබුණ ආදයම වූ රුපියල් දශ ලක්ෂ 17,809 ඉලක්ක ගත ප්‍රමාණයට වඩා සියයට 8 කින් පහත වැටුණ අතර, විදේශාධාර වශයෙන් බලාපොරොත්තු වූ රුපියල් දශ ලක්ෂ 14,198 ක මුදලින් තුනෙන් දෙකක ප්‍රමාණයක් හෙවත් රුපියල් දශ ලක්ෂ 9,270 ක් පමණක් 1982 දී ලැබිණි.

විශේෂයෙන්ම, ජාතික ඉතිරිකිරීම් බැංකුව වැනි බැංකු නොවන ග්‍රාහක මාර්ගවලින් ණය වශයෙන් ලබාගත් සම්පත් කැපී පෙනෙන ලෙස වැඩි විය. එහෙත් ආදයමෙහි මෙන්ම විදේශීය මූල්‍යකරණයෙහි ද අඩුවීම මකා හැරීමට එම වැඩිවීම ප්‍රමාණවත් නො විය. එසේ වුවද, බොහෝ දුරට වසර තුළදී ආහාර කොමසාරිස්වරයාගේ තොග මට්ටම පහත වැටීමෙන්, රජයේ අත්තිකාරම් ගිණුම් කටයුතු වසර ගණනාවකට පසු භාණ්ඩාගාරයට කරන ආපිට ගෙවීමක් පෙන්නුම් කළේය. මෙකී වර්ධනය පවතිද්දීත් අයවැයෙහි ජංගම ගිණුමෙහි හිඟයක් සටහන් විය. 1981 දී අත්තිකාරම් ගිණුමෙහි විශාල ශුද්ධ පිටත ගෙවීම බැහැර කළ විට ජංගම ගිණුම් අතිරික්තයක් පෙන් වූ බව මෙහි ලා සැළකීම වැදගත් ය. මෙකී වර්ධනයනට සරිලන අන්දමින් මුළු වියදමෙහි ගැලපීම් සිදු නොවූයෙන්, දළ දේශීය නිෂ්පාදිත සමානුපාතයක් වශයෙන් මුළු අයවැය හිඟය වැඩි විය. මෙයට අමතරව, 'ග්‍රාහක' මාර්ගවලින් වැඩි වැඩියෙන් ණය ලබා ගැනීමේ හේතුවෙන් පෞද්ගලික අංශයේ ආයෝජන කටයුතු සඳහා ලබාගත හැකිව තුබුණ සම්පත් වලින් කොටසක් ද අත්කර ගනු ලැබිණි.

## 1 . 6 සංඛ්‍යා සටහන

### ගෙවුම් තුලන සංක්ෂිප්ත වාර්තාව 1977 — 1982

රුපියල් දශ ලක්ෂ (විගැහි දශ ලක්ෂ වරහන් තුළ)

| | 1977 | 1978 | 1979 | 1980 | 1981 | 1982(අ) |
|---|---|---|---|---|---|---|
| වෙළෙඳ භාණ්ඩ අපනයන .. | 6,640<br>(651) | 13,207<br>(675) | 15,282<br>(759) | 17,603<br>(818) | 20,507<br>(903) | 21,434<br>(934) |
| වෙළෙඳ භාණ්ඩ ආනයන .. | 6,290<br>(622) | 15,600<br>(819) | 22,570<br>(1,121) | 33,915<br>(1,576) | 36,123<br>(1,596) | 41,902<br>(1,826) |
| සාධක-නොවන සේවා (ශුද්ධ) .. | + 457<br>(+44) | + 356<br>(+18) | + 979<br>(+48) | +1,290<br>(+60) | +1,950<br>(+85) | +2,094<br>(+91) |
| සාධක සේවා (ශුද්ධ) .. | – 153<br>(–15) | — 237<br>(–12) | – 239<br>(–12) | – 432<br>(–20) | –1,712<br>(–75) | –1,968<br>(–86) |
| පෞද්ගලික සංක්‍රාම (ශුද්ධ) .. | + 123<br>(+12) | + 342<br>(+17) | + 754<br>(+37) | +2,260<br>(+105) | +3,918<br>(+172) | +5,170<br>(+225) |
| ජංගම ගිණුම් ශේෂය (ඇ) .. | +1,266<br>(+117) | –1,032<br>(–75) | –3,556<br>(–177) | –10,912<br>(–507) | –8,342<br>(–375) | –11,793<br>(–515) |
| මූල්‍ය නොවන ප්‍රාග්ධන (ශුද්ධ) .. | + 326<br>(+32) | +2,600<br>(+133) | +3,306<br>(+164) | +6,585<br>(+306) | +7,691<br>(+341) | +9,885<br>(+431) |
| උපලබ්ධි වූ විදේශ ආධාර (ශුද්ධ) (ආ) .. | +1,243<br>(+119) | +3,906<br>(+200) | +4,451<br>(+221) | +4,685<br>(+217) | +6,343<br>(+300) | +7,278<br>(+317) |
| කෙටි කාලීන ණය (ශුද්ධ) .. | – 237<br>(–22) | – 40<br>(–2) | + 1<br>(–) | +2,604<br>(+121) | + 386<br>(+17) | – 63<br>(–2) |
| වෙනත් මූල්‍ය නොවන ප්‍රාග්ධන .. | – 190<br>(–18) | – 366<br>(–19) | +1,093<br>(+54) | +1,577<br>(+74) | +4,080<br>(+160) | +6,049<br>(+263) |
| මූල්‍ය සංචලනයෙන් පියවන ලද ශුද්ධ ජාත්‍යන්තර සංචිතයේ වෙනස්වීම .. | –3,313<br>(–153) | –1,861<br>(–65) | – 793<br>(–35) | +2,967<br>(+166) | + 406<br>(+26) | +1,149<br>(+24) |
| **වැදගත් දත්තයන් කීපයක්** | | | | | | |
| වෙළෙඳ අනුපාතය .. | 102 | 100 | 72 | 58 | 46 | 38 |
| ඛනිජ තෙල් ආනයන (ශුද්ධ) .. | 867<br>(83) | 1,459<br>(75) | 2,707<br>(134) | 5,034<br>(234) | 6,592<br>(291) | 8,994<br>(391) |
| දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් ජංගම ගිණුම් හිඟය .. | — | 3 | 7 | 18 | 11 | 13 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් ශුද්ධ ආධාර උපලබ්ධ .. | 4 | 10 | 9 | 9 | 10 | 9 |
| දළ ජාත්‍යන්තර සංචිත .. | 5,573<br>(306) | 7,477<br>(371) | 9,652<br>(475) | 6,766<br>(296) | 9,222<br>(387) | 10,956<br>(466) |

(අ) තාවකාලිකයි

(ආ) ශුද්ධ නිළ සංක්‍රාම ඇතුලුව

(ඇ) ශුද්ධ නිල සංක්‍රාම නොමැතිව

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

වර්ෂය තුළ දී ඇති වූ අනපේක්ෂිත විකාශනයන්ගෙන් එකක් ගෙවුම් තුලනය හමුවෙහි වීය. විශේෂ ගැනුම් හිමිකම් (විගැහි) දශ ලක්ෂ 24 ක (රුපියල් දශ ලක්ෂ 1,149) සමස්ත හිගය 1981 හිගයට වඩා ඉතා සුළු වශයෙන් අඩු වුවද, වෙළෙඳ හා ජංගම ගිණුම් හිගය 1982 තියුණු අන්දමින් පුළුල් විය. වෙළඳ භාණ්ඩ හා ජංගම යන ගිණුම් දෙකෙහි පිළිවෙලින් සිදුවී ඇති වීගැහි දශ ලක්ෂ 892 සහ විගැහි දශ ලක්ෂ 515 ක හිඟ වාර්තා වී ඇති විශාලම හිඟයන් වේ. ජංගම ගිණුම් හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 13 ක් වූ අතර, පෙර වර්ෂයේ මට්ටමට වඩා පිරිහීමක් පෙන්නුම් කළේය.

අහිතකර වෙළඳ අනුපාතය, 1982 දී, නොකඩවා, සිව්වැනි වසරටත් බාහිර ගෙවුම් තත්ත්වය මත අයහපත් බලපෑම් ඇති කළ අතර, එය වෙළෙඳ භාණ්ඩ ගිණුමේ වැඩිමනත් අසමතුලිතතාවයක් ඇති කිරීමට ද දයක විය. හීන වූ වෙළෙඳ අනුපාතයෙන් පිළිබිඹු වන අන්දමට ශ්‍රී ලංකාවේ පාරම්පරික අපනයන භාණ්ඩවලට ඇති ලෝක ඉල්ලුම පහත් මට්ටමක පැවතීම ජංගම ගිණුමේ පරිහානියට හේතු වූ අතර, ලබාගත් ආනයන වැඩිවීම ඒ තරමින්ම ඊට හේතු විය. වැඩි වූ ආනයන වලින් විශාල ප්‍රමාණයක් ආධාර යටතේ ගෙන් වූ නමුදු, 1981 දී වූ සියයට 1 ක වැඩිවීම හා සසඳන විට ආනයන සියයට 14 කින් වැඩි විය. අනෙක් අතට විගැහි අනුව සියයට 3.4 ක් වූ 1982 අපනයන සාධනය බලාපොරොත්තු කඩකරවන සුළු වේ. හීන වූ ලෝක ඉල්ලුම අපේ අපනයනවල මිල පහත හෙළීමටත්, අහිතකර නිෂ්පාදන උපනතීන් අපනයන පරිමාවේ පසුබැස්මකටත් හේතු වූ බව සත්‍යයක් වුවද, නිරතුරුවම වැඩිවෙමින් පවතින ආනයන ඉල්ලුම හමුවේ අපනයන වර්ධන අනුපාතය මන්දනය වීම අපනයන නිෂ්පාදන වැඩිකරවීමට හා සමාන අවධාරණයකින් යුතුව මෙතෙක් ප්‍රයෝජනයට නොගත් ආනයන ආදේශන ක්ෂේත්‍රය දියුණු කිරීමට වහාම ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාවය දක්වාලයි.

විශාල වෙළෙඳ භාණ්ඩ හා ජංගම ගිණුම් හිඟයන් තිබූ නමුදු, පිටරට රැකියාවල නියුක්ත වූවන්ගේ ප්‍රේෂණවලින් මූලික වශයෙන් සමන්විත වූ පෞද්ගලික සංක්‍රාම ලැබීම් වැඩිවීමත්, ඍජු ආයෝජන වශයෙන් සහ ඉතා සහනදායි අන්දමේ දිගුකාලීන විදේශ ණය වශයෙන් ශුද්ධ ප්‍රාග්ධනය බොහෝ සෙයින් ගලා ඒමත් ගෙවුම් තුලනයෙහි සමස්ථ හිඟය කුඩා පරිමාවක තබාගැනීමට උපකාරී විය. 1982 දී වූ පෞද්ගලික සංක්‍රාම රුපියල් දශ ලක්ෂ 5,789 (විගැහි දශ ලක්ෂ 252) ක් හෙවත් 1981 ලැබුණු ප්‍රමාණයට වඩා රුපියල් දශ ලක්ෂ 1,359 (විගැහි දශ ලක්ෂ 57) ක් විය. ශුද්ධ ප්‍රාග්ධන ගලා ඒම් 1981 රුපියල් දශ ලක්ෂ 7,691 (විගැහි දශ ලක්ෂ 341) හා සසඳන කල, 1982 දී රුපියල් දශ ලක්ෂ 9,885 (විගැහි දශ ලක්ෂ 431) ක් විය. එහෙත් දළ විදේශ වත්කම් සියයට 20 කින් රුපියල් දශ ලක්ෂ 10,956 (විගැහි දශ ලක්ෂ 466) දක්වා වැඩි වූ නමුදු, රටෙහි ශුද්ධ විදේශ වත්කම්වල තවත් අඩුවීමක් වර්ෂයේ දී දක්නට හැකි විය. දළ විදේශ වත්කම්වල වැඩිවීමක් ඇති වූයේ, මහ බැංකුව හා වෙළෙඳ බැංකු යන දෙකෙහිම වගකීම් වැඩි වූ බැවිනි. 1982 අවසානයේ වූ දළ විදේශ වත්කම් මාස 3 ක පමණ ආනයන පියවීමට සෑහුණි.

අපනයනවල සෙමින් සිදු වූ වර්ධනය මෙන්ම මෑත අතීතයේ වෙළෙඳ ණය කෙරෙහි වූ වැඩි නැඹුරුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ණය සේවා ගෙවීම් (ජා.මු. අරමුදලෙන් හැරගැනීම් සහ රාජ්‍ය අංශයේ සැපයුම්කරුවන්ගේ ණය ද ඇතුළුව) අධිකවීම ණය සේවා අනුපාතය 1981 දී පැවති සියයට 13.3 සිට 15.2 දක්වා ඉහළ යාමට හේතු විය. මෙම කාලපරිච්ඡේදය තුළ ජා.මු.අ. ගණුදෙනු ඇතුළත් නොවූ ණය සේවා අනුපාතය සියයට 6.8 සිට 9.5 දක්වා වැඩිවිය.

1982 ගෙවුම් තුලන විකාශනයෙහි දක්නට ලැබුණු වඩාත් අසතුටුදයක ලක්ෂණය වූයේ අපනයන අංශයෙහි ලා දක්වූ මුළුමනින්ම ගතික බවින් තොර වීමය. 1977 ආර්ථික ප්‍රතිශෝධනවල තිබූ මූලධර්මය වූයේ ආරම්භක වශයෙන් විදේශීය ඉතිරිකිරීම් මගින් බාහිරාවලෝකන සංවර්ධන උපක්‍රමයක් යෙදවීමත් අනතුරුව අපනයන අංශයේ ව්‍යාප්ති-ඇතිකර ලීමෙන් මැදි කාලයේදී ගෙවුම් තුලනය ශක්තිමත්ව පවත්වාගෙන යා හැකි

තත්ත්වයකට ගෙන ඒමත් ය. 1982 දී අපනයන අංශය අචලව තිබීම සහ ජංගම ගිණුම් හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 13 දක්වා ඉහළ යාමද, ඒ සමඟම ණය සේවා අනුපාතය වැඩිවීමෙන් ද අදහස් වන්නේ ගෙවුම් තුලනය පවත්වා ගත හැකි තත්ත්වයට ගෙන ඒමේ කාලසීමාව තවදුරටත් දීර්ඝ වන බවයි. එසේම මීට පිළියම් යෙදීමේ ක්‍රියාදමයකට ඇති කාලසීමාවද අනුරූප වශයෙන් කෙටිවී ඇති බව එමගින් හෙළිවෙයි.

ණය ආපසු ගෙවීමේ කාල සීමාව දීර්ඝ කිරීමේ වැඩපිළිවෙලවල්වලට හේතුවන අයුරින් ණය සහ පොළී ගෙවීම් පිළිබඳ බරපතල ප්‍රශ්නවලට තුඩුදී ඇති රටවල් ප්‍රමාණය ඉහළ යමින් පවතින මෙවැනි අහිතකර ජාත්‍යන්තර වාතාවරණයක් අනුව සළකන විට පෙනී යනුයේ, විවෘත ආර්ථික රාමුවක පිහිටා අඛණ්ඩ ආර්ථික දියුණුවක් ලබා ගැනීමට නම් හැකි තරම් කෙටි කාලයක් තුළ දී ගෙවුම් ශේෂය ශක්‍යතාවයට පත් කර ගැනීම ඉතා වැදගත් අවශ්‍යතාවයක් බවයි. මේ තත්ත්වය යටතේ ඉතිරි කිරීම්, ආයෝජන සහ අපනයන කටයුතු සඳහා අවශ්‍යවන්නාවූ හිතකර වාතාවරණයක් සැළසීමට ද උද්ධමනය මැඩ පවත්වා ආර්ථිකය සංවර්ධනය කරා යොමු කිරීමේ වැඩපිළිවෙලෙහි සාර්ථක භාවය වැඩිකර ලීමට ද, ඉල්ලුම් පාලනය කිරීමේ ප්‍රතිපත්තීන් උපකාරී විය හැක. එහෙත් වඩාත් මූලික ගැටළුවලින් සමන්විත ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ තත්ත්වය, හුදෙක් ඉල්ලුම් පාලනය කිරීමේ ප්‍රතිපත්ති අනුගමනය කිරීමෙන් පමණක් විසඳාලිය හැකි නොවේ. මෙම අවස්ථාවේදී අපනයන වර්ධනයෙහි ලා දැඩි ආයාසයකින් කළයුතු වැයම් පිළිබඳව නිවැරදි ක්‍රම භාවිතය කිරීම සහ අපනයන දියුණු කිරීම උදෙසා උපකාරී වන්නාවූ ප්‍රතිපත්තීන් අනුගමනය කිරීමද අවශ්‍යය. මෙම කරුණු රජයේ ක්ෂණික සැළකිල්ලට යොමු වීම අත්‍යවශ්‍යය.

ශ්‍රී ලංකාවේ බලශක්ති අංශයට අදල ප්‍රශ්න සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ තවදුරටත් උග්‍රවූ බවක් පෙණින. ආර්ථිකමය හා සමාජයීය කටයුතු පුළුල්වීමෙන් ප්‍රධාන බලශක්ති මූලයන් සඳහා ඇති වී තිබෙන ඉල්ලුමෙහි වැඩිවීම මෙන්ම, 1981 දී තෙල් මිළ ඉහළ යාමද බොරතෙල් හා ඛණිජතෙල් නිෂ්පාදිත සඳහා වන ආනයන පිරිවැය සීඝ්‍ර අන්දමින් වැඩිවීමට හේතු වී ඇත. 1982 දී ඛණිජ ද්‍රව්‍ය ආනයනය සඳහා වැය කළ මුදල විගැහි වටිනාකම අනුව බලන කල සියයට 20 කින් වැඩිවිය. ඛණිජ තෙල් හැර ඉතිරි අපනයනයන්ගෙන් 1982 දී ශ්‍රී ලංකාව ලත් මුළු ඉපයීම්වලින් සියයට 67 ක් ඛණිජ තෙල් ආනයනය සඳහා වැය කරන ලදී. කලින් වර්ෂයේ දී මෙය සියයට 56 ක් පමණක් විය. තවද, විදුලි බලය සඳහා වූ වැඩි ඉල්ලුම සපුරාලනු ලැබුවේ අමතර තාප බල උත්පාදනය කිරීමෙන් වන අතර, ඊට වැඩිපුර ඛනිජ තෙල් ද්‍රව්‍ය ආනයනය කිරීමට සිදු විය. කළු තෙල් හා නැප්තා වැනි අනෙක් අපනයනය කළ හැකි තෙල් නිෂ්පාදිතයන්ගේ පාරිභෝජනය අධික වීම නිසා ඉකුත් වසර කිහිපය තුළ වැඩිවෙමින් තිබුණු ඛණිජ ද්‍රව්‍ය අපනයන වටිනාකම ද සියයට 4 කින් අඩු විය. තෙල් ආනයන ශුද්ධ පිරිවැය අපනයන ඉපයුම්වල මුළු එකතුවේ ප්‍රතිශතයක් ලෙස ගත් කළ 1981 දී වූ සියයට 32 සිට 1982 දී සියයට 41 දක්වා වැඩි විය. මෙය වැඩි වන ඉල්ලුමත් සමඟ එක්වන ඉහළ මිල ගණන් හේතුකොට ගෙන ගෙවුම් ශේෂ තත්ත්වය කෙරෙහි ද අධික පීඩනයක් ඇති කළේ ය.

රටෙහි ගෙවුම් ශේෂ තත්ත්වය අනුවත්, බලශක්ති අර්බුදයට තුඩු දුන් දශකය තුළ ශ්‍රී ලංකාව ලත් අත්දැකීම් වලිනුත්, අවධාරණය වනුයේ, හැකි තරම් කෙටි කාලසීමාවක් තුළ තෙල් ආනයන කෙරෙහි රටෙහි පවතින ගැති භාවය ලිහිල් කර ගැනීමේ අවශ්‍යතාවයයි. කෙටිකාලීනව අනුගමනය කළ හැකි වෙනත් ප්‍රතිපත්ති උපක්‍රමයන් ද ඒ හා සමාන අන්දමින් වැදගත් වන අතර, ඒ මගින් බලශක්ති උපයෝගී කරණයෙහි කාර්යක්ෂමතාවය දියුණු කිරීමත්, අරපිරිමැස්ම ඇති කර ලීමත්, ඉලක්ක කර ගත යුතුය. මෙකී කරුණෙහි ලා 1982 ජූනි මාසයේ දී ''ස්වාභාවික සම්පත් බලශක්ති සහ විද්‍යා අධිකාරිය'' පිහිටුවීම එවැනි ප්‍රතිපත්තීන් සකස් කිරීමට හා ක්‍රියාත්මක කරවීමට අවශ්‍ය ආයතනමය රාමුව බිහිකරලීම උදෙසා ගන්නා ලද වැදගත් පියවරක් වෙයි. මේ අධිකාරියේ ක්‍රියාවලියට වෙනත් දේ අතර, ශ්‍රී ලංකාවේ බලශක්ති අවශ්‍යතාවයන්ට අයත් සියළුම අංශවලට අදල ප්‍රතිපත්තීන් ද ඇතුළුව බලශක්ති මූලයන් හි සමස්ථ සංවර්ධනය අරබයා ගතයුතු සැළසුම් හා බලශක්තිය උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගැනීම හා එය අර පිරිමැසුම් කිරීම පිණිස ගතයුතු පියවරවල් සම්බන්ධයෙන් ඇමතිවරයාට උපදෙස් දීමද ඇතුළත්ය.

22493
21 APR 2009

ශ්‍රී ලංකාවේ ආනයන ව්‍යුහයේ මෑත වර්ෂවලදී සිදුවී ඇති වැදගත් වෙනස්කම් නම්, අන්තර් හා ආයෝජන භාණ්ඩවල දයකත්වයේ සිදුවී ඇති වැඩිවීමයි. සහල් සහ අනෙකුත් අතුරු ආහාර භෝග නිෂ්පාදනයේ වැඩිවීම, පාරිභෝජන භාණ්ඩ ආනයන ප්‍රමාණයේ ලිහිල්වීමකට දයක වී ඇති අතර, මෙම ක්‍රියාදමය තවත් වේගවත් කළයුතුව ඇත. ආනයන ආදේශනය උදෙසා මෙන්ම අපනයන කාර්යයන් උදෙසා ද කෘෂිපාදක කර්මාන්ත අංශයේ තවමත් ඉෂ්ටකර නොගත් එහෙත් වැඩිදියුණු කළ හැකි කටයුතු විශාල ප්‍රමාණයක් එසේම පවතී. මහවැලි යෝජනා ක්‍රමය යටතේ ඉඩම් එළිපෙහෙළි කිරීමත් සමඟ, වී වලට අමතරව වෙනත් භෝග වගාව සඳහා ප්‍රමාණවත් ඉඩකඩ සැළසෙනවා ඇත. මෙකී සංවර්ධන කටයුතු හේතු කොට ගෙන වී නිෂ්පාදනයේ විය හැකි වැඩිවීම හා එසේ පැහැදිලිව පෙනීයන සැපයුම් වැඩිවීම කරණකොට ගෙන සිදු විය හැකි මිල පිරිහීමකින් කෘෂි අංශය පීඩාවට පත්වීමට ඉඩ නො තැබීම ද අවශ්‍යය. වී නිෂ්පාදනයේ ධෛර්ය ගන්වන සුළු වේග ශක්තිය අනාගතයේදීත් නොකඩවා පවත්වා ගෙන යාමට නම්, සහල් අපනයනයෙහි ඇති හැකියාවන් පිළිබඳව සැළකිලිමත් විය යුතුය. කෙසේ වෙතත්, විශාල වූත්, කෙමෙන් වැඩිවෙන්නාවූත්, ආනයන පිරිවැය කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇති කිරීමට නම් ඉන්ධන අරපිරිමැස්ම කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධාරණය කළ යුතුය. තවද, අවශ්‍යයෙන්ම විදේශීය වෙළෙඳ බැංකුවලින් ලබාගත් ණය මගින් නාවික හා ගුවන් සේවා අංශයන් හි කරන ලද විශාල ආයෝජනයන්, ණය සේවා බර අධික කරලීමෙන් සහ රජයට අය-වැය ප්‍රශ්න ඇති කර ලීමෙන් තොරව පවත්වා ගැනීමට නම් ඒවායේ කාර්යයන් ස්වශක්තියෙන්ම කර ගෙන යාම සිදුවිය යුතු බව වැදගත් ය.

ආනයන අංශය අතින් මෙකී ක්‍රියා මාර්ගයන් අනුගමනය කළද, ශ්‍රී ලංකා ආර්ථිකය පවත්වා ගෙන යාමට අවශ්‍ය ආනයන, අධික ප්‍රමාණයකින් නො වෙනස්ව පවතිනවා ඇත. ඒ අනුව අපනයන අධි වේග කිරීමේ ප්‍රතිපත්තියෙන් ඉවත්වීමට නම් නොහැකිය. වැඩි වැඩියෙන් ඉසිලීමට සිදුවෙතැයි අපේක්ෂිත ණය සේවා කරණ බර, පෞද්ගලික සංක්‍රාම ගලා ඒම ඉහළම ස්ථානයට පැමිණීම සහ අනුග්‍රහ සහිත ණය ලබාගැනීම පිළිබඳ ඇති අසතුටුදයක බලාපොරොත්තු යන කරුණු යථෝක්ත කර්තව්‍යය වහාම ඉටු කර ලිය යුතු බව දක්වාලයි. එසේ වුවද, වත්මන් ජාත්‍යන්තර වාතාවරණය අනුව සළකන කල, අපනයන අධි වේග කිරීම ලෙහෙසි පහසු කාර්යයක් නොවේ. කාර්මික රටවල් හි හටගෙන ඇති සංවර්ධන පසු බෑම සමග අත්වැල් බැඳගත් ඉහළ යමින් පවතින රැකියා විරහිත අනුපාතය මෙකී රටවල්වල ආනයන ඉල්ලුම මැඩලීමට තුඩු දී ඇත. එසේම, කාර්මික රටවල්වල හටගෙන ඇති ආර්ථික පසුබෑමේ තත්ත්වය බාහිර රටවලින් ගෙන්වන භාණ්ඩවලට පනවන තහංචි දැඩි කිරීමට ද මහ පාද ඇත. එකී රටවල්වල දැනට පනවා ඇති රාජ්‍ය මූල්‍ය හා මූල්‍ය ප්‍රතිපත්තීන් සිය අපනයනයන් කෙරෙහි ඇති කරන බලපෑමට අමතරව, නාමික හා මූර්ත පොළී අනුපාත අධික භාවයට පත් කිරීමට ද හේතු වූ අතර, එනිසා ජාත්‍යන්තර සංවිධානවලින් ගත් ණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට දැරීමට සිදු වන ණය සේවාකරණ බර කෙරෙහි ද අමතර බලපෑමක් ඇති කරනු ඇත. එවන් අහිතකර වාතාවරණයන් තිබුණද, වහාම කළයුතු විශිෂ්ඨ වූ අනාගත බලාපොරොත්තු තැබිය හැකි කාර්යය වනුයේ, වැව්ලි අපනයන පරිමාව වැඩි දියුණු කිරීම උදෙසා එල්ල කළ පරිශ්‍රම මගින් රටෙහි අපනයන ඉපැයුම් කෙටි කාලීන වශයෙන් වර්ධනය කිරීමය. රජයේ ප්‍රකාශිත ප්‍රතිපත්තිය මත, අවශ්‍යයෙන්ම අපනයන ආශ්‍රිත කටයුතුවලට පමණක් අනාගතයේ දී බදු විරාම සැළසීම සීමා කිරීම හිතකර කටයුත්තක් වුවද, නව අපනයන හා ආනයන ආදේශන කාර්යයන් ආරම්භ කිරීම පිණිස අවශ්‍ය වන්නා වූ වාතාවරණය සැළසීම පිණිස ශ්‍රී ලංකාවේ තීරු බදු ව්‍යූහය තාර්කික පදනමක් මත යලි සකස් කිරීම හිතකර ක්‍රියා මාර්ගයක් වනු ඇත.

ආර්ථිකය නිදහස් කොට, එය විවෘත බාහිරාවලෝකන ක්‍රමයක් මත ගොඩනැඟීමේ අරමුණෙන් ශ්‍රී ලංකාව දියත් කළ ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙලට දැන් පස් වසක් ගත වී ඇත. ඉකුත් පස් වසර තුළ දී එහි සැහෙන ප්‍රගතියක් ලබා ඇත. මෙහි වඩාත්ම කැපී පෙනෙන සාර්ථකත්වයක් දක්නට ලැබුණේ, 1977 ට කලින් කාලය තුළ පැවති අඩු ආයෝජන හා පහත් වර්ධන

රටාවෙන් අත් මිදීමට මෙරටට හැකි වීමය. ඉකුත් වර්ෂයේ වාර්ෂික වාර්තාවෙන් පෙන්නුම් කළ පරිදි, ශ්‍රී ලංකාවේ අපනයන පදනම් කර ගත් වර්ධන ක්‍රමය මුළුමණින්ම එදිරි සහගත ජාත්‍යන්තර ආර්ථික වාතාවරණයක් මැද ක්‍රියාත්මක කොට උරගා බැලීමට සිදුවීම අවාසනාවකි. එහෙත්, අහිතකර වර්ධනයන් මධ්‍යයේත්, ආර්ථික දියුණුව නොනවත්වා ඉදිරියට ගෙන යැමට හැකි වීම විශිෂ්ටය. මෙරට ඉතිරිකිරීම් හා ආයෝජන ප්‍රමාණය කෙරෙහි ද ගෙවුම් තුලනය හා අයවැය ක්‍රියාකාරිත්වය කෙරෙහි ද විශාල වශයෙන් බලපෑ විකාශන 3 ක් විය. ඒවා නම්, ආනයන පිරිවැය සැහෙන අයුරින් වැඩි කරමින්, බණිජ තෙල් මිල දෙගුණ වීම, අපනයන සඳහා ඉල්ලුම, රජයේ ආදායම සහ තරමක්දුරට ආධාර ගලා ඒම අඩුකරමින් බටහිර රටවල සිදු වූ ආර්ථික පසුබැස්ම සහ වෙළෙඳ අනුපාතයෙහි නො නැවතී සිදුවූ පරිහානියට හා රටේ පොදු ආයෝජන වැඩපිළිවෙලෙහි පිරිවැය නංවන සුළු වූ ජාත්‍යන්තර උද්ධමනය වේ. කෙසේ වුවද, ශ්‍රී ලංකාවේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයෙහි සාමාන්‍ය වර්ධන අනුපාතිකය ඉකුත් පස් වසරේ දී සියයට 6.2 ක් විය. පොදු ආයෝජන වැඩපිළිවෙලක් අනුගමනය කළ රාජ්‍ය අංශය සහ පාලනයන් බොහොමයකින් විමුක්ත වූ පෞද්ගලික අංශය ද, මෙකී සංවර්ධන ප්‍රයත්නයට දයක වී ඇති අතර, එමගින් සේවා නියුක්තියෙහි ලා සැළකිය යුතු වර්ධනයක් ද ඇති කර තිබේ.

ආංශික වශයෙන්, වඩාත්ම කැපී පෙනෙන සුළු නියත වර්ධනය විශේෂයෙන්ම, වී වගාව ඇතුළත් කෘෂිකාර්මික අංශයේ සිදු වූ අතර, කාර්මික අංශයේ ද තරමක දියුණුවක් ඇති විය. එහෙත්, සාමාන්‍යයෙන්, වෘක්ෂ – භෝග නිෂ්පාදනයෙහි හා අපනයන අංශයෙහි වර්ධනයක් ඇති නො වීම කලකිරවන සුළුය. තවද, දේශීය ඉතිරිකිරීම් ප්‍රමාණවත් ලෙස වැඩි නොවී පවතින අවස්ථාවක, සහනදයක ආධාර ගලා ඒම මගින් පිටිවහලක් ලැබුවද, අධික ආයෝජන මට්ටමක් පැවතීමෙන් පෙන්නුම් කැරුණේ, විදේශීය වාණිජ බැංකුවලින් ණය ගැනීම් වැඩිවීමක්, සංචිත අඩුවීමක් හා විනිමය අනුපාතිකයෙහි පහත වැටීමක් සිදු වී ඇති බවය. ආයෝජන මට්ටම ඉහළ නැඟීමෙන් දේශීය වශයෙන් ඇති වූ බලපෑම් වූයේ, මිල වැඩිවීම් වේගය ඉහළ යාමත්, ආයෝජන පිරිවැය වැඩිවීමත්, නොකඩවා පැවති උද්ධමනාත්මක ප්‍රවනතාවක් මධ්‍යයේ ආයෝජන වලින් පරිබාහිරව පාරිභෝජනය උදෙසා සම්පත් යෙදවීමෙන්, ඉතිරි කිරීම් සැළකිය යුතු අයුරින් වැඩි නොවීමය. කෙසේ වුවද, මෑත වර්ෂ වලදී එළදයී ඉල්ලුම් පරිපාලන ප්‍රතිපත්තීන් අනුගමනය කිරීම නිසා, සමතුලිත තාවය පෙරළා ඇති කර ගැනීමට හැකි වී තිබේ. එහෙත් ගෙවුම් තුලනයේ ජංගම ගිණුමෙහි ද, අයවැය ලේඛණයෙහි ද, ඔරොත්තු දෙන අන්දමේ හිඟයන් පවත්වා ගැනීමට වග බලාගැනීම අරමුණු කර ගත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරවීම සඳහා මහජනතාවගෙන් තවදුරටත් විශාල පරිත්‍යාගයන් කරන ලෙස ඉල්ලා සිටීමට අවශ්‍යයෙන්ම සිදු වෙයි. මෙරට දැනට අනුගමනය කරනු ලබන ආර්ථික උපක්‍රමයෙන් ප්‍රයෝජනයක් ලබා ගැනීමට නම්, මෙකී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ නොකඩවා පවත්වාගෙන යායුතු බවට පැහැදිලි ලකුණු තිබේ. ආර්ථික හා විනිමය අනුපාතික ප්‍රතිසංස්කරණයන්හි ප්‍රධාන අරමුණු-වලින් එකක් වූ අපනයන වර්ධන වේගය වැඩි කිරීම ක්‍රියාත්මක වී නොමැත. පවත්නා ජාත්‍යන්තර ආර්ථික වාතාවරණය අනුව, මෙම අරමුණු සපුරාලීම දුෂ්කරවන නමුදු, විශේෂයෙන්ම ආනයන වර්ධන වේගය අනුවත්, වෙළෙඳ අනුපාතයෙහි පිරිහී යන උපනතිය අනුවත්, එය තවදුරටත් වැදගත් අරමුණක් වශයෙන් පැවතිය යුතුය.

වර්ෂය තුළ දී ඒ ඒ අංශයන්හි සිදු වූ වර්ධන විකාශනයන් ඉදිරි කොටස් වල සවිස්තරව දක්වනු ලැබේ.

## දළ ජාතික නිෂ්පාදිතය, ආදායම සහ වියදම

### සමස්ත උපනතීන්

පවත්නා සාධක වියදම් මිල අනුව ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතය (ද.ජා.නි.) 1982 දී රුපියල් කෝටි 8,970 ක් වශයෙන් තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත. මෙය පෙර වසර හා සසඳා බලන කල සියයට 15.5 ක වැඩිවීමකි. මිල වැඩිවීම් සඳහා යම් ප්‍රමාණයක් අත්හල විට දළ ජාතික නිෂ්පාදිතයේ මූර්ත වර්ධනය 1982 දී සියයට 4.9 ක් වේ. එය පෙර වසරේදී සියයට 4.1 ක් විය. දළ ජාතික නිෂ්පාදිත ඇස්තමේන්තු අනුව ගණනය කරන ලද 1982 වර්ෂය සඳහා වන ආරෝපිත දළ ජාතික නිෂ්පාදිත ගැලපුම සියයට 10.2 ලෙස ඇස්තමේන්තු ගතය. පසුගිය වසර දෙක හා සංසන්දනය කරන විට මෙය සැලකිය යුතු අඩු මට්ටමක් පෙන්නුම් කරයි.